**2026.01.13 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 ජනවාරි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගිත්වය :-

| | | |
|---|---|---|
| 1. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 2. ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා | - | ගරු උප සභාපති |
| 3. කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4. පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 5. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 6. ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 7. ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 8. උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 9. ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 16. ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ලියනගමගේ අභයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 19. එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 20. යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 21. ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 22. බී. සෞම්‍යකුමාර ද සිල්වා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 23. ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**<u>ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරු, ප්‍රාදේශීය සභා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. <u>පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම</u> :-**

1.1. 2025.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවට අදාළ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**<u>සංශෝධන අංක 01 - ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**

පසුගිය සභා වාරයේ මා විසින් කල් නොදුන් යෝජනා යටතේ ඉදිරිපත් කළ 5.2.16 යෝජනාවේ සඳහන් "ඉදිරි උත්සව සමය සමඟ දෛනික වැඩ අවශ්‍යතා සඳහා" යන්න "ඉදිරි සංචාරක සමයේ කසල කළමනාකරණ කටයුතු හා දෛනික වැඩ අවශ්‍යතා සඳහා" ලෙස සංශෝධනය විය යුතුය.

2025.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන</u> :-**

2.1. පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක 4/04/06 හා 2025.12.31 දිනැතිව "දේපළ තහනම් කිරීමේ නිලධාරී වෙත ගෙවනු ලබන කොමිස් මුදල සම්බන්ධවයි." මැයෙන් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව දේපළ තහනම් කරන නිලධාරියාට චක්‍රලේඛයේ සඳහන් පරිදි ගෙවීම් කටයුතු සිදු කරන බවට දන්වා ඇති බව සභාව දැනුවත් කරන ලදී.

2.2. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4/05/09 හා 2025.12.10 දිනැතිව "ප්‍රාදේශීය සභාවේ පොදු කටයුතු සඳහා වෙන් වූ ඉඩමේ කුරුඳු වගා කිරීම සම්බන්ධවයි" මැයෙන් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩමක් බැවින් වගා කටයුතු සඳහා ලබා දීමට නොහැකි බවට දන්වා ඇති බව ගරු සභාව දැනුවත් කරන ලදී.

2.3. ගාල්ල වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකගේ අංක CC/P/GEN/විවිධ - 2026 හා 2026.01.12 දිනැතිව "2026.01.08 දින බෙන්තර වෙරළ තීරයේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම" මැයෙන් යුතුව ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එම අනවසර ඉදි කිරීම්වල සුන්බුන් ඉවත් කිරීමට සභාවේ වාහන හා ශ්‍රම දායකත්වය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති බව සභාව දැනුවත් කරන ලදී.

**3.** **<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-</u>**

3.1. අංක 19/ගාල/ඒ/01 හා 2025.12.22 දිනැතිව "සැලසුම් කමිටුව සඳහා නිලධාරීන් පත් කිරීම" මැයෙන් යුතුව දකුණු පළාත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමිය විසින් යොමු කරන ලද ලිපිය ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2026 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිත වශයෙන් බලාත්මක සැලසුම්කරු ලෙස එම්. වී. ශිරෝමා රංජනී මෙනවිය පත් කරන බව දන්වා ඇති බව සභාව දැනුවත් කරන ලදී.

**4.** **<u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> :-** නැත

**5.** **<u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**5.1.** **<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.1.1. අංක BP/TC/04/03/2025 හා 2025.12.11 දිනැතිව බලපිටිය කාර්මික විද්‍යාලයේ විදුහල්පතිගේ ඉල්ලීම් ලිපිය පරිදි එම ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව නිමකළ ජා.හැ. අංක 200651302139 දරණ අයි. පී. ජනනි චමෝදි විජේරත්න සිසුවිය සඳහා අප ආයතනයේ මාස 06 ක පුහුණු කාලයක් මෙන්ම සභා අරමුදලින් දෛනික පුහුණු දීමනා ලෙස රු. 1,000/- ක් ගෙවීමට යටත්ව ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේක අපේ පෞද්ගලික සම්බන්ධතාවයකින් ගන්න එකක් නෙවෙයි. සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා, සමෘද්ධි බැංකු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ආයතනවලට කාර්මික විද්‍යාල හා ආධුනිකත්ව මණ්ඩලවල පරිගණක පුහුණුව ලබන සිසුන් ප්‍රායෝගික පුහුණුවට එවනවා. මේ ලිපිය එවලා තියෙන්නේ බලපිටිය කාර්මික විද්‍යාලයෙන්. ඔවුන්ගේ පාඨමාලාව සම්පූර්ණ කරන්න මේ පුහුණුව අවශ්‍යයි. දිනකට රු. 1,000/- ක් ගෙවන්න ඕනේ. අපේ බල ප්‍රදේශයේ දරුවෙක් නිසා මේ පුහුණුව ලබා දීම සුදුසුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.2. බෙන්තොට ප්‍රාදේශීය සභා මහ ඌරගහ පෙර පාසල ස්ථිර ස්ථානයක අලුතින් ඉදි කිරීම සඳහා පරිත්‍යාගශීලියෙකු විසින් ලබා දීමට නියමිත, බලයලත් මිනින්දෝරු එම්. ටී. රංජිත් ආනන්ද මහතා විසින් 2023.06.06 දින අඳින ලද 7253 දරණ පිඹුරේ නිරූපිත 34 B දරණ පර්චස් 29.33 ක විශාලත්වයෙන් යුතු ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරා ගැනීම සුදුසු බවටත්, ඒ සඳහා වන තැගි ඔප්පු සකස් කිරීම සඳහා වැයවන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා**

එතුමා මේ ඉඩම මුදලට අරගෙන තමයි පරිත්‍යාග කරන්නේ. මෙය ඉඩමේ අයිතිය හිමි ඉන්ද්‍රලතා මහත්මියටත්, ඉඩම පරිත්‍යාග කෙරු ප්‍රේමරත්න මහතාටත් විශාල පිනක්. ඉඩමේ ඔප්පුව ලබාදීමේ කටයුතු 16 වන සිකුරාදා දින ප්‍රධාන කාර්යාලයේ දී සිදු කිරීමට නියමිතයි. ඒ සඳහා මාධ්‍යවේදී මහත්වරුන්ටත් සහභාගි වෙන්න කියලා ආරාධනා කරනවා.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.45 ට ගරු මන්ත්‍රීවරුන් වන ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා සහ ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

ඔබ සියලු දෙනාම දන්නවා වසර ගණනාවක් කුඩා ඌරගහ පෙර පාසල පවත්වාගෙන ගියේ ............... විහාරස්ථානයේ. අපිට හැකියාවක් තිබුණේ නෑ සභා අරමුදල් යොදලවත් වෙනත් ස්ථානයක මේක ගොඩනගන්න. පසුගිය කාලයේ අපි පෙර පාසලේ විවිධ අවස්ථාවන්වලට සහභාගි වුණා. දැඩි දුෂ්කරතාවයක් තියෙනවා. එහි ධර්ම ශාලාවේ තමයි පෙරපාසල පවත්වාගෙන යන්නේ සෙල්ලම් මිදුලක් ලබාදෙන්න විදියක් නෑ. පන්සලේ ඉඩ ප්‍රමාණය අඩුයි. පන්සලේ උත්සවයක් තියෙන වෙලාවට ළමයි එළියේ ඉන්නවා. මේ වෙලාවේ අපි ගොඩක් ස්තූතිවන්ත වෙනවා එම විහාරාධිපති හිමියන්ට ඒ විදිහට හරි පෙර පාසල පන්සලේ පවත්වාගෙන යන්න ඉඩ ලබා දුන්නට. එම පෙර පාසලේ පසුගිය උත්සව අවස්ථා දෙකකදීම සභාපතිවරයා විදියට මම ඉල්ලීමක් කළා ගමේ අයගෙනුත් උත්සවයට සම්බන්ධ වෙලා හිටපු සියලු දෙනාගෙනුත් පෙර පාසල පවත්වාගෙන යන්න ඉඩමක් ලබල දෙන්න කියලා. මේ වෙලාවෙ ස්තූතිවන්ත වෙනවා අපේ කොට්ඨාසයේ ගරු මන්ත්‍රීතුමා වන තිලක් උපුල් මන්ත්‍රීතුමාට. පන්සල ළඟම තියනවා ඉඩමක් එතුමා ඒ ඉඩම අයිති නිවසට ගිහිල්ලා ඒ අය එක කතා කරලා. ඊට පස්සේ ඒ ඉඩම වෙනත් ව්‍යාපාරිකයෙක් හරහා තමයි සභාවට ලබා ගන්නේ. ඒ ව්‍යාපාරික මහතා තමයි අයි. ඩී. ප්‍රේමරත්න.

- මේ අවස්ථාවේදී අයි. ඩී. ප්‍රේමරත්න මහතා විසින් යොමු කරන ලද ලිපියක් ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව අපිට කාලයක් තිස්සේ තිබුණු ගැටලුවකට විසඳුමක් විදිහට මේ පෙර පාසලට ඉඩමක් ලබාදීම සම්බන්ධව තිලක් මන්ත්‍රීතුමාටත්, ප්‍රේමරත්න මහතාටත්, ලක්ෂ 14 ක මුදලක වටිනාකමින් යුත් ඉඩම ලක්ෂ 07 ක මුදලට ලබාදීම සම්බන්ධව ඒ ඉඩමේ අයිතිය හිමි ඉන්ද්‍රලතා හේවාවිතාරණ මහත්මියටත් ස්තූතිවන්ත වෙමින් අපේ සභාවේ ගෞරවය පුදකර සිටිනවා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.50 ට ගරු සභිකවරුන්ගේ සමූහ ඡායාරූපය ලබා ගැනීමට සභාව මිනිත්තු 25 කට කල් තැබීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය ස්ථිර කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු මිනිත්තු 25 කට අත්හිටවන ලදී.

- පෙ.ව. 10.15 ට මහා සභාවේ කටයුතු නැවත ආරම්භ විය.

5.1.3. අංක 19/ගාල/ඒ/01 හා 2025.12.22 දිනැතිව දකුණු පළාත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමිය විසින් යොමු කරන ලද ලිපිය අනුව 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අප සභාවේ සැලසුම් කමිටුව සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිත වශයෙන් බලාත්මක සැලසුම්කරු ලෙස එම්. වී. ශිරෝමා රංජනී මෙනවිය පිළිගැනීම සුදුසු බවටත්, එම නිලධාරිනියට යැපීම් දීමනාව සහ ගමන් වියදම් දීමනාව ගෙවීම් කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.4. උත්සව අවස්ථා හා රැස්වීම්වලට ගෝනගල සතිපොළ භූමිය යොදා ගත හැකි පරිදි එහි ස්ථිර වේදිකාවක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ වන විට විවිධ දේශපාලනික සංස්කෘතික උත්සව සඳහා ගෝනගල සතිපොළ යොදා ගන්නවා. ඒ හින්දා අපි ඒකේ එක කෙළවරක ස්ථිර වේදිකාවක් සකස් කරමු. අඩි විස්සක විසි පහක විතර ලොකු වේදිකාවක් ඉදිකරලා තිබ්බම සාමාන්‍යයෙන් මට දැනෙන විදියට උත්සව සඳහා යොදාගන්න පුළුවන්. සභාවේ සිදු කරන උත්සව ගත්තත් අවුරුද්දකට තුන හතරක් තියෙනවා. එක උත්සවයක් සඳහා වේදිකාවක් ඉදිකරන්න රුපියල් 25,000 ක් 35,000 ක් අතර වැය වෙනවා. විවෘත වේදිකාවක් ඉදිකරලා තිබ්බම සභාවට විතරක් නෙවෙයි ඒකෙන් සේවාව ගන්න සියලුම ආයතනවලට සියලුම සංවිධාන වලට මේක අවස්ථාවක් වෙයි. ඒ වගේම සභාවක් විදියට අපිට ආදායම වැඩි කරගන්නත් පුළුවන්. දැනට භූමිය රුපියල් 10,000 කට තමයි ලබා දෙන්නේ. ඒක රුපියල් 25,000 ක් වගේ වැඩි කර ගන්න පුළුවං මේ හරහා. ඉතින් ඒ නිසා ආදායමකුත් මේ හරහා ලැබෙන නිසා තමයි මම මේ යෝජනාව දැම්මේ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.5. බෙන්තොට පුස්තකාලය සහිත දෙමහල් වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ නව සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

අපි වාර්ෂික කල්බදු ක්‍රමයට තමයි පුස්තකාලය සහිත දෙමහල් ගොඩනැගිල්ල බදු දීලා තිබුණේ. නමුත් එහිදී අසාධාරණයක් වෙනවා. මේ අවුරුද්දේ බිස්නස් එක හැදීගෙන එනකොට ලබන අවුරුද්දේ කඩේ ආපහු

වෙන කෙනෙකුට යනවා. ඒ නිසා කවුරුවත් ඒකේ ස්ථිරව ඉන්නෙත් නෑ. මේ නිසා අපි එක්වන් මුදලකට දෙන්න තීරණය කරා. අපි බලාපොරොත්තු වුණු මුදලට වඩා වැඩි මුදලට මෙම කඩ අලෙවි වුණා. බෙන්තර කියන්නේ අනාගතයේ ඉතා දියුණු නගරයක්. බොහෝ වෙලාවට ටියුෂන් පන්ති වගේ දේවල් වලට ගන්න පුළුවන් වෙන්න සම්පූර්ණ හෝල් එකම එක විදියට හෝ නැතිනම් කඩකාමර විදියට කඩ කාමර පහක් ඉදිකරන්න පුළුවන් මෙතන. අනිත් කාරණය තමයි උඩ දාල තියෙන්නේ ස්ලැබ් එකක්. අනාගතය ගැන හිතලා තමයි ස්ලැබ් එකක් දාලා තියෙන්නේ. ඒ හින්දා වෙළඳ සංගමයක් ඇති කරලා ඒ හරහා ආදායමක් ලැබෙන හින්දා අපට සභාවට යන වියදම මේ මුදලින් ලබාගන්න පුළුවන්. මේ හරහා කෝටියකට ආසන්න මුදලක් අපට ලබාගන්න පුළුවන් වෙනවා. ඒ වගේම මේ අවුරුද්ද අවසානය වන විට මෙය ඉදිකරන්න වැයවෙන මුදල අපට එක්වන් මුදල හරහා ආපහු ලබාගන්න පුළුවන් වෙයි. අපිට හෝල් එකම සම්පූර්ණයෙන් දෙන්න පුළුවන් වුණොත් අපේ වියදම අඩුයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.6. නැවත සභාවට පවරා ගන්නා ලද බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට වෙළඳ කුටිය නවීකරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සභාවට අයත් මෙම කඩකාමරය බොහෝ කාලයක සිට බදු දීලා තිබුණේ. මේ ස්ථානයේ වුණ වෙනස්වීම් සමඟ දොරටුව ළඟම කඩයක් තිබීම අශෝභන වෙන්න පුළුවන්. නිසි ආකාරයෙන් එතන ක්‍රියාත්මක නොවුණොත් සභාවේ තියෙන පරිසරයත් එක්ක නොගැළපෙයි කියන අදහසත් එක්ක ඒ අය සමඟ සාකච්ඡා කරලා ඒ කඩේ නැවත සභාවට ලබාගත්තා. ඒ අයට දෙලක්ෂ ගාණක පමණ ගාස්තුවක් ගෙවන්න තිබුණා. ඒක ඒ අයට දීල දැන් මේක සභාවේ වත්කමක් විදිහට තියෙනවා. අපිට පුළුවන් මේක තව ලස්සන කරලා හොඳ තත්ත්වයේ කඩයක් බවට පරිවර්තනය කරලා ටෙන්ඩර් කරන්න. නැත්නම් සභාවේ තියෙනවා සුභ සාධක සංගමයක්. අපිට ඒ හරහා මේක පවත්වාගෙන යන්න පුළුවන්. අපිට වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ටත් හදිසියකට තේකක් බොන්න තැනක් නෑ. ඒ නිසා අපටත් සේවාවක් විදියට තමයි මම මේ යෝජනාව ගෙනාවේ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.1.7. බෙන්තොට පාලම අසල නාගරික සංවර්ධන අධිකාරියෙන් අප සභාවට පවරන ලද භූමියට ගැළපෙන පරිදි වෙළඳ සැල් 03 ක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමටත් ඒ සඳහා වැයවන පිරිවැය අප සභාව පවත්වාගෙන යන නාගරික සංවර්ධන අධිකාරියේ අංක 2838079 දරණ ගිණුමෙන් ගෙවීම් කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>

මේ භූමියේ අපට තියෙනවා පොඩි ගැටලුවක්. සිතියම්ගත කරලා තියෙන විදිහට ඒකෙ කොටසක් බස්නාහිර පළාතට අයිති වෙන විදියට තමයි සිතියම් ගත කරලා තියෙන්නේ. මේ සිතියම මම ලබා ගත්තේ ග්‍රාමසේවක මහතාගේ කාර්යාලයෙන්. ඒ වගේම ඒ ෆොන්ටූන් එකෙන් බේරුවල ප්‍රාදේශීය සභාවට බදු ගෙවනවාද කියලත් හොයලා බලන්න.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

ගූගල් සිතියමේ මේක පෙන්නන්නෙ සම්පූර්ණයෙන්ම පාලම් දෙකෙන් එහා කෙළවර කියලා.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

නීත්‍යානුකූලව නාගරික සංවර්ධන අධිකාරියට තමයි මේකේ අයිතිය තියෙන්නේ. අපේ අනුමැතිය අරගෙන තමයි එතන ඕක හැදුවෙ. ඒ කොටස අපට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලියවිල්ලක් මඟින් පවරලා තියෙනවා. පසුගිය දිනවල නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂකතුමියක් සහකාර අධ්‍යක්ෂකතුමියත් මේ සම්බන්ධ සාකච්ඡාවකට පැමිණියා.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

අපි ඔය වෙනුවෙන් සභාව විදියට පෙනී ඉන්න ඕනේ. ගඟ - බෙන්තර ගඟ. බෙන්තර අලුත්ගම ගඟ නෙවෙයි. සිතියමේ පැහැදිලිවම බෙන්තර ගඟ මැදින් තමයි මායිම ලකුණු කරලා තියෙන්නේ. අපිට මේක දැන් වටින දෙයක් නොවෙන්න පුළුවන්. නමුත් අනාගතයේ යම් දවසක ඕක තීරණාත්මක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. බෙන්තර ගඟේ තියෙන ෆොන්ටූන් එක නිසි ලෙස බදු ආදායම් සභාවට ගෙවන්න ඕන. ඒ සඳහා ගරු සභාවේ අවධානය යොමු වෙන්න ඕනේ. සභාව මේකේ නඩත්තු කිරීම් කරනවා. වතුර සපයනවා. බවුසරයෙන් වතුර ගිහින් ගහනවා. සභාවට ආදායමක් එන්නේ නෑ. ඒකෙන් සේවාවක් වෙනවා නම් ප්‍රශ්නයක් නෑ. සේවාවක් සපයනවා වගේම ආදායමක් ලබනවා නම් සභාවට බදු ගෙවන එක ඒ අයගේ යුතුකමක් සහ සභාවේ වගකීමක් ඒ අයගෙන් බදු අයකර ගන්න එක. සිතියම සම්බන්ධයෙන් කතා කරොත් මේක ජාතික ප්‍රශ්නයක් වෙන්න පුළුවන් අනාගතයේදී. යම් සිතියමක් භාවිත කරනවා නම් ඒකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ සොයා බලන්න ඕනේ. ඒ පිළිබඳ මැදිහත් වෙන්න ඕන. මේක මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් ඇඳපු සිතියමක්ද, නැතිනම් වෙන කෙනෙකුගේ වුවමනාවකට නිර්මාණය කරපු සිතියමක්ද කියන කාරණාව දිහා බලලා වැඩ කටයුතු කරන්න කියන ඉල්ලීම මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

නාගරික සංවර්ධන අධිකාරියෙන් ලොකුවට කොන්ක්‍රීට් දාලා කරන්න දෙන්නෙත් නෑ මේක. එතන තියෙන ස්වභාවික සෞන්දර්යට ගහත් එක්ක ඒ අය ලොකුවට කොන්ක්‍රීට් තට්ටු දාලා හදනවට කැමති නැහැ. අපිට ඕන කරන්නේ එතන අපි නඩත්තු කරන නිසා, අපි අතුගානවා සුද්ද කරනවා නමුත් ආදායමක් ලැබෙන්නෙ නෑ. ඒ නිසා ආදායමක් ලබා ගන්න. ඒ වගේම එතන ඉන්න අය දැඩි දුෂ්කරතාවයට පත්වෙනවා ටොපියක් කාලා කොළයක් දාන්නවත් තැනක් නෑ. පසුගිය කාලේ ඕතන එක එක වෙළඳාම් කරා. නමුත් ඒවා නීත්‍යානුකූල නෑ වගේම එතන අප්‍රසන්නතාවයක් තියෙනවානේ. ගඟේ තියෙන ෆොන්ටූන් එකට අනුමැතිය දීලා තියෙන්නේ බෙන්තරින් තමයි. බෙන්තර ප්‍රාදේශීය ලේකම්තුමන් හරහා ග්‍රාම නිලධාරීතුමන් තමයි ලයිට් ගන්න අනුමැතිය දීලා තියෙන්නේ.

මේ අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා ස්ථීර කිරීමෙන් අනතුරුව පෙ.ව. 10.29 ට මහා සභාව කාරක සභාවක් බවට පත්විය.

- එහිදී ආදායම් පරීක්ෂක නුවන් උපාලි මහතා එම ෆොන්ටූන් එක පිළිබඳව ද එයට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව ද පැහැදිලි කිරීමක් සිදුකරන ලදී.

කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කළ යෝජනාව ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.31 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**5.2. ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-**</u>

5.2.1. 12 F වියන්දූව වසමේ කිරලගහවෙල මාර්ගයේ ළිඳ ළඟ සිට අශෝක මහතාගේ නිවස දක්වා මාර්ගය පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**</u>
වැස්ස කාලෙට මේ මාර්ගයේ ගමන් කිරීම අපහසුයි. ප්‍රදේශවාසීන්ගේ දැඩි ඉල්ලීමක් තියෙනවා මේ මාර්ගය සකස් කරලා දෙන්න කියලා. සංවර්ධන සැලැස්මෙත් මේ මාර්ගය නම් කරලා තිබුණා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.2. 12 D සූරියගම වසමේ නගරසිරි උද්‍යානය තේක්කවත්ත මාර්ගයේ ප්‍රවේශය (හබුරුගල පාසල අසල) සහ එම මාර්ගයේ අතරමැද ගිලා බැස ඇති කොටස පිළිසකර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රුසිත නන්දන තුෂාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.2.3. හබුරුගල ධර්මරාජ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය අසල සිට දිවෙන නගරසිරි උද්‍යානය තේක්කවත්ත මාර්ගයට යාබද කාණුව ජලය ගලා නොබැසීම හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති වී ඇති අතර ජලය ක්‍රමවත් ලෙස ගලා බැසීමට එම ගැටලුව විසඳීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා</u>**
මේ මාර්ගයේ කොන්ක්‍රීට් කාණුවක් දාලා පාර කොන්ක්‍රීට් කරලා දැන් අවුරුදු 05 ක් විතර වෙනවා. එම මාර්ගයේ වතුර රැඳෙනවා. වැස්ස කාලෙට වැස්ස නැවතුණත් කාලයක් යනකන් වතුර රැඳිලා තියෙනවා. එය වතුර බැස යන විදියට සකස් කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
මේ මාර්ගය හොඳට තියෙනවා. කොන්ක්‍රීට් කරපු පාරක්. පිට්ටනිය අසල වර්ග අඩි එකක ප්‍රමාණයේ කොටසක් ගිලා බැහැලා තියෙනවා. ඒ කොටසට මේ වන විට පස් දාලා පුරවලා තියෙන්නේ. මේ අවස්ථාවේම ඒක කොන්ක්‍රීට් කරන්න පුළුවන් නම් වටිනවා.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
තාක්ෂණ සේවා නිලධාරී හරහා වාර්තාවක් අරගෙන බලමු.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.3. <u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.3.1. බෙන්තොට ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ යෙදෙන පුද්ගලයින් අපහසුතාවයට පත්වන අයුරින් පිටස්තර පුද්ගලයින් පැමිණ කුළී රථ සේවයේ යෙදීම වැළැක්වීමට සුදුසු පියවරක් ලබා ගැනීමටත් වාහන රථගාල් ක්‍රියාත්මක කර සභාවට ආදායමක් ලබා ගැනීමටත් මේ සඳහා බෙන්තොට බල ප්‍රදේශයේ වාහන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි කර එම වාහන සඳහා විශේෂ රථගාල් වරප්‍රසාදයක් ලබා දීම මඟින් මේ සඳහා ක්‍රමවේදයක් ඇති කිරීමටත් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මදුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
බෙන්තර ප්‍රදේශය ගත්තම ලියාපදිංචි රථගාල් යම් ප්‍රමාණයක් තියෙනවා. සංචාරක ප්‍රදේශයේ ඒ වගේම හෝටල් ආශ්‍රිතව ඒ වගේම හන්දිවල තියෙනවා. ඉතින් ඒ ක්‍රමවේදයට අමතරව විශේෂයෙන් විවිධ ඇප් හරහා විශේෂයෙන් බාහිර ප්‍රදේශවලින් ඇවිල්ලා සංචාරකයෝ අරගෙන යන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒක ලංකාවටම බලපාන ප්‍රශ්නයක්. ජාතික මට්ටමින් හොයන්න ඕන ප්‍රශ්නයක් ඒ වගේම මේකට සභාවක් විදිහට සභා පනතේ තියෙන බලතල ප්‍රකාරව අපට පුළුවන් කටයුතු කරන්න. ඒක නවත්තන්න වැඩපිළිවෙළක් සකස් කරන්න පුළුවන්. සභාවෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කරලා ඒ හරහා ඒක ක්‍රියාත්මක කරන්න කියලා මම සභාවෙන් ඉල්ලීමක් කරනවා. මොකද ඒ හරහා ඇත්තටම බාහිර ප්‍රජාව මේකට එන එක අපිට වළක්වන්න ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන්නම් අපි ඒකට සුදුසු ක්‍රියාමාර්ගය ගමු. ඒ සඳහා මම මේ සභාවේ ඉන්න හැමෝගෙන්ම යෝජනා සහ අදහස් බලාපොරොත්තු වෙනවා. හැමෝගෙම අදහස් අනුව මේකට හොඳ වැඩපිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕන කියන තැන මම ඉන්නවා.

<u>**ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය**</u>

නදීෂාන් මන්ත්‍රීතුමා හැමෝගෙම අදහස් හා යෝජනා සලකා බලනවා කිව්ව නිසා මම මේක ඉදිරිපත් කරනවා. ඇත්තටම මම මේ යෝජනාවට විරුද්ධයි. ඒකට හේතුව එතුමාගේ යෝජනාව අනුව පික් මී, ඌබර් වගේ එක එක ඇප් හරහා බෙන්තර ප්‍රදේශයේ සංචාරකයින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම නතර කිරීමේ අරමුණින් කියන එක එතුමා සඳහන් කළා. පසුගිය සම්බන්ධීකරණයෙත් මම මේ ගැන කතා කරා. අපි හැමෝම දන්න දෙයක් තමයි රජයේ ලියාපදිංචි ඇප් එකක් හරහා තමයි මේවා දුවන්නේ. අපි හැමෝම පිළිගන්න ඕන දෙයක් තමයි අපිට මේක නතර කරන්න බෑ. අපි ඒ වෙලාවේ ඉල්ලීමක් කරා බෙන්තර ප්‍රදේශයේ උදේ හයේ ඉඳන් රාත්‍රී දහය වෙනකම්ම අනිත් ප්‍රදේශවල ඒක නතර කරලා තියෙනවා වගේ ඒකවත් අපිට කරල දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒ වෙලාවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිශාන්ත පෙරේරා මැතිතුමා සඳහන් කළේ සංචාරක මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා තීරණයකට එමුයි කියලා. ඇත්තටම ප්‍රශ්න කීපයක් මතුවෙනවා. එකක් තමයි බෙන්තර ප්‍රාදේශීය සභාව සතු රථගාල් මොනවද? අපිට ඒ ප්‍රවාහන පහසුකම් දෙන්න පුළුවන් තැන් තියෙනවද? එතකොට ඒ පහසුකම් අපට නෑ. එහෙම දෙන්න තියෙනවනම් අපිට තියෙන්නෙ බලිවල පිට්ටනිය විතරයි මේ ප්‍රදේශයේ. බෙන්තර පාලමේ ඉඳන් බෙන්තර හන්දියට වෙනකන් වාහන 163 ක් තියෙනවා. එතකොට ඒ අයත් එදා ඉඳන්ම ඉල්ලලා තියෙන්නේ ප්‍රාදේශීය සභාවෙනුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් යම් ලියාපදිංචියක් ලබා දෙන්න කියලා. නමුත් අපි ලියාපදිංචි කළ බලපත්‍රයක් දෙනවානම් මම දන්න තරමට අපි ඒ රථගාල් සඳහා වැසිකිළි පහසුකම්, ගාල්කර තැබීමේ පහසුකම් ආදී සියලු දේවල් ඒවට නිලධාරීන් යොදවලා කරන්න ඕන. අපි ලියාපදිංචිය දෙනවනම් ගරු සභාවෙන් ලියාපදිංචිය අරගෙන ඕනම කෙනෙක්ට පුළුවන් මෙතන වාහන පාක් කරන්න. එතකොට අපි හැමදාමත් සම්බන්ධීකරණයේ දී කතා කළේ මේ බෙන්තර ආසන්නයේ කට්ටිය රථවාහන දුවන්නේ සංචාරක කර්මාන්තය කරන්නේ. එතකොට මේ සියලු දෙනා ප්‍රවාහන පහසුකම් සපයන්න එන්න හදන්නේ බෙන්තරට සංචාරකයන් බහුලව ඉන්න කාලයට විතරයි. මම අහන්න කැමතියි අනිත් දවස් වලටත් එනවද කියලා. අනිත් දවස් වලට ගැටලුවක් නෑ. එතකොට සංචාරකයන් බහුලව ගැවසෙන කාලයට විතරයි මේ හැමෝම බෙන්තරට ඇවිල්ලා ලියාපදිංචි වෙලා වාහන දුවන්න හදන්නේ. එතකොට ඒ වාහන මෙහෙට ගේන්න දීලා මේ බෙන්තර ප්‍රදේශයේ මේ කර්මාන්තයෙන් පමණක් යැපෙන මිනිස්සුන්ට තිබෙන තත්ත්වය කුමක්ද? පික්මී ඌබර් පහසුකම් තියෙනවා. සභාවෙනුත් ලියාපදිංචි කරගෙන තවත් පිරිසක් යොදාගෙන ඉන්නවා. මම මේ යෝජනාව සම්බන්ධයෙන් මගේ විරෝධතාවය පළ කරනවා

<u>**ගරු මන්ත්‍රී, ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා**</u>

මේ ඇප් ගැන සලකා බලද්දී ගාන පිළිබඳ ප්‍රශ්නයක් එනවා. ඌබර් කට්ටිය ගොඩක් ගණන් අඩුයි. මුලින් ඒ අය ආවේ දේශීය අය සඳහා පස්සේ තමයි ඒ ගොල්ලෝ සංචාරක කර්මාන්තයට පැන්නේ. සංචාරකයන්වත් ඒ ගානටම අරගෙන යනවා. ඒක ලොකු පාඩුවක් රටට. මම නම් කලිනුත් යෝජනා කළේ සංචාරකයන්ට වෙනම ගාණක් ක්‍රියාත්මක කරන්න කියලා.

<u>**ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා**</u>

මන්ත්‍රීතුමා සද්භාවයෙන් දාපු යෝජනාවක් මේක. එතුමාගේ අදහස බැලුවොත් එහෙම මේ ගැටලුව සඳහා විසඳුමක් සභාව තුළින් හෝ සපයා දීම තමයි එතුමාගේ උත්සාහය වුණේ. හැබැයි මට පේන විදියට පළාත් පාලන ආයතනයක මට්ටමින් විසඳුමක් සෙවීම අමාරුයි. පසුගිය සම්බන්ධීකරණ කමිටුවෙත් කතා කළා මේක රජය මැදිහත්වීමකින් විසඳිය යුතු ප්‍රශ්නයක් කියන එක. මේකට ලියාපදිංචියක් දුන්නොත් ඒ අයට නීත්‍යානුකූල බලපත්‍රයක් දුන්නා වගේ වෙනවා. බෙන්තර නවාතැන් ගන්න.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**
මේ කාලෝචිත ගැටලුවක්. මේක බෙන්තරට විතරක් නෙවෙයි මුළු ලංකාවටම සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හැමතැනම කතා කරන ප්‍රශ්නයක්. කොයි පැත්තට ගියත් ලංකාවෙම කතා වෙන ප්‍රශ්නයක්. බෙන්තර සංචාරක කර්මාන්තය ඉහළ නැංවීමට දැවැන්ත වැඩපිළිවෙළක් අවශ්‍ය වෙලා තියෙනවා. මේක සභාව මගින් විසඳගන්න බැරි ජාතික ප්‍රශ්නයක්.

**<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>**
සංචාරක මණ්ඩලයට, සංචාරක අමාත්‍යතුමාට, සම්බන්ධීකරණ කමිටුවට මේ ගැන දැනුම් දීලා මුළු රටටම මේ ගැටලුව ගැන පැහැදිලි කිරීමක් කරොත් අපට ඉදිරියේදී විසඳුමක් ලැබේවි.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මම විශ්වාස කරනවා මේ යෝජනාව ඉදිරිපත් කරපු නදීෂාන් මන්ත්‍රීතුමා මෙන්ම අදහස් දක්වපු සියලු මන්ත්‍රීවරු අද දවසේ උත්තරයක් මේ ගැන බලාපොරොත්තු වෙන එකක් නැහැ කියලා. මොකද මේ පිළිබඳ කතිකාවතක් ඇති කරන්නනේ එතුමාට ඕන වෙලා තිබුණේ. සභාව විදියට මම දකින්නේ ජාතික මට්ටමේ ප්‍රශ්නයකට අපි තනියෙන් මුහුණ දෙන එකේ ගැටලුවක් තියෙනවා. සභාවක් විදියට රටේ පවතින නීති රීති සමග බැහැ ඌබර්, පික් මී වැනි විවිධ නම් වලින් පවතින ඇප් නවත්තන්න හෝ බලපෑම් කිරීම නෛතිකව අපට කරන්න බැහැ. මන්ත්‍රීතුමා කිව්ව පනත අනුව අපට රථගාල් හදන්න අයිතියක් තියෙනවා ඒකට අයකර ගන්නත් පුළුවන්. ඒකට යම් ක්‍රමවේදයක් තියෙනව මොකද අපට සිද්ධ වෙනවා පනතේ තියෙන බලතල අනුව අතුරු ව්‍යවස්ථාවක් සකස් කරන්න හැදුවට මදි ඒකෙන් අපි කරන්න බලාපොරොත්තු වෙන දේ ඒකෙන් ලැබෙන ප්‍රතිලාභය ඒ සඳහා දෙන පහසුකම් ඒ පහසුකම් ලබා දෙන්න අපට තියෙන යටිතල පහසුකම් ආදී ඔය සියල්ල සලකා බලන්න ඕනා. ඊට පස්සේ පළාත් පාලනයට යවල ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරන් ඕන අපි ඒවා කරන්න අනික මේ ප්‍රදේශයේ සභාවට අයිති ඉඩම් සීමිත ප්‍රමාණයයි තියෙන්නේ. ඒ නිසා අපට රථගාල් සකස් කරන්න ලැබෙන ඉඩ ප්‍රස්ථාව අවමයි. ක්‍රමවේද හරහා ඒවා සිදු කරන්නත් බොහෝ කාලයක් යයි. මම මේකෙන් කියන්නේ නෑ කරන්න ඕන නෑ කියලා. අපිට හැකියාවක් තියෙනවා අපේ සභාවේ යෝජනාවක් විදියට සම්බන්ධීකරණයට යොමු කරන්න මම මේ වෙලාවේ මේකට තීන්දුවක් නොගෙන සිටීම සුදුසුයි කියලා හිතනවා.

ඒ අනුව ඉහත යෝජනාව ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට තීරණය කරන ලදී.

5.3.2. පහළගම්භය උප කාර්යාලය තුළ හබුරුගල උප තැපැල් කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු පරිදි ක්‍රමවේදයක් සලසා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>**
හබුරුගල උප තැපැල් කාර්යාලය පහළගම්භය බල ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම් එකොළහකට පමණ සේවය සපයනවා. මේක තියෙන්නේ පිටි මෝලක කොටසක. මනුස්සයෙක් හබුරුගල හන්දියට බස් එකෙන් ආවොත් එහෙම තව මීටර් 700 ක් 800 ක් පයින් යන්න ඕනේ. හබුරුගල උප කාර්යාලයේ සෙනඟ ගැවසෙනව අඩුයි. ආයුර්වේදයට හා පුස්තකාලයට පමණයි වැඩි පිරිසක් පැමිණෙන්නේ. විශාල භූමි

ප්‍රමාණයක තමයි උපකායීලය පිහිටලා තියෙන්නේ. ඒ නිසා ඉඩකඩ තියෙනවා. උප තැපැල් කාර්යාලය මෙම ස්ථානයේ ස්ථාපිත කරන්න පුළුවන් නම් සභාවක් විදියට අපි ජනතාවට කරන ලොකු සේවයක් ඒක.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

දැනට එතන තියෙන ගැටලුව තමයි පහත මාලය උප තැපැල් කාර්යාලයක් සඳහා දෙන්න ඉඩ පහසුකම් තියෙනවද කියන එක. ආයුර්වේදය කොහොමත් පහත මාලයේ තමයි පවත්වාගෙන යන්න ඕන. ඒක අපේ පනතේ සහ සේවාවේ අංක එක. ඒ හින්දා ඒක අපිට එතනින් අයින් කරන්න බෑ. දෙවෙනි කාරණය තමයි පුස්තකාලය. ඒකත් අපේ සේවාවේ ඉහලින්ම තියෙන එකක් ඒ දෙකට ගැටළුවක් වෙන විදිහට වෙනත් ආයතන පිහිටුවන්න අපිට බෑ. අපි අපේ සේවය මුලින්ම හොඳින් ලබා දෙන්න ඕන අවහිරයක් නොවී. උඩුමහලේ නම් කොටසක් ලබා දෙන්න පුළුවන්. නමුත් උප තැපැල් කාර්යාලයක් උඩුමහලකට ගැලපෙන්නෙ නෑ. වැඩිහිටිදීමනා, මහජනාධාර ලබාගන්න ජනතාව පැමිණෙනවා. ඒ අයට අපහසුවක් උඩුමහලට නගින බහින එක.

මෙම අවස්ථාවේදී පෙ.ව. 11.05 ට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් මහා සභාව කාරක සභාවක් බවට පත්කිරීමට කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාව බවට පත්විය.

- මෙහිදී තාක්ෂණ සේවා නිලධාරී අර්.ජේ.එස් මාදුවාගොඩ මහතා විසින් තිබෙන සේවාවන්වලට ගැටළුවක් ඇති නොවී උප තැපැල් කාර්යාලයක් සඳහා කාර්යාලය ඇතුළතින් කොටසක් ලබාදීමට හැකිද නැතිනම් එලියෙන් කොටසක් වෙන්කරන්න හැකියාවක් තිබේද යන්න පිළිබඳ අදහස් දක්වන ලදී.

කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :-</u>**

5.4.1. තොටකනත්ත පොදු සුසාන භූමිය පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව හන්දියේ සිට මහවත්ත කිරලගහවෙල දක්වා මාර්ගය දෙපස පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථීර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.3. තුන්දූව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව විමලදර්ශන මාවත මාර්ගයේ දෙපස පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථීර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>5.5. ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.5.1. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් පාලන ආයතනවල කුඩා පාලම් වැඩි දියුණු කිරීමේ තිරසාර ව්‍යාපෘතිය - 2026 යටතේ රන්තොටුවිල ආචාරිගේවත්ත පාලම ඉදි කිරීම ව්‍යාපෘතිය සිදු කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථීර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මෙය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් සිදු කරන්නේ. සභාවෙන් තමයි අධීක්ෂණ කටයුතු සහ අඩුපාඩුකම් සොයා බලන්නේ. මේ පිළිබඳ තිබ්බ ස්ථානීය පරීක්ෂණයකට මම සම්බන්ධ වුණා. කොට්ඨාසයේ මන්ත්‍රීවරයා විදිහට අපේ පුණ්‍ය ශ්‍රීලාල් මන්ත්‍රීතුමා සහභාගී වුණා. මේ වන විට ඇස්තමේන්තු සකස් කරලා තියෙන්නේ.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.2. අංක 9 සී හබක්කල ග්‍රාම නිලධාරී වසමේ අකාඩිගේවත්ත ඉඩමේ ඉඳුරුව, හෙට්ටිගොඩ, නො.381/ඒ ලිපිනයේ පදිංචි ඩබ්. ඩී. වී. සංජීවනී මහත්මියගේ නිවසට යන මාර්ගයේ, මාර්ගය කෙළවර පිහිටා ඇති ගිනිකුරු ගස් දෙක එම මාර්ගයේ ගමන් ගන්නා වාහන සඳහා අවහිරතාවයක් ඇති කරන බැවින් එම ගස් දෙක කපා ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථීර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ ගස් පවතින ඉඩමට නඩුවක් තියෙනවා. නමුත් මහ ජනතාවට මේ නිසා අවහිරයක් වගේම අනතුරුදායක නිසා සභාවට හැකියාව තියෙනවා මේ ගස් කපා ඉවත් කරන්න. ඒ නිසා ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙමු.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.3. සැපයුම් විෂය භාර නිලධාරී විසින් සකස් කර ඉදිරිපත් කර ඇති 2026 වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දුෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

සෑම වර්ෂයකම සිදු කරන දෙයක් මේක. පත්තරේ දැන්වීමක් පළ කරලා ඊට අමතරව දැනුවත් කිරීම් සිදු කරලා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගන්නවා.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.4. 2026 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
දැනට අප විසින් වර්ෂය තුළ ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂිත භාණ්ඩ හා සේවා සපයා ගැනීමට අදාළ සැලැස්මයි මේ. මේ සඳහා සභා අනුමැතිය අවශ්‍යයි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.5. 2025 වර්ෂයේ බෙන්තොට ඓතිහාසික ගලපාත රජ මහා විහාරස්ථ ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පූජෝපහාර පෙරහැර මංගල්‍යය සඳහා අයවැයෙන් වෙන් කරන ලද රු. 100,000/- ක මුදල පරිත්‍යාග කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සාමාන්‍යයෙන් වාර්ෂිකව රජ මාවත ඔස්සේ වීථි සංචාරය කරන මහ පෙරහැර සඳහා සභාවෙන් රු. 100,000/- ක මුදලක් ලබා දෙනවා. මේ වර්ෂයෙත් පෙරහැර කමිටුව විසින් ඉල්ලීමක් කරලා තියෙනවා මුදලක් ලබා දෙන්න කියලා. නමුත් මේ වර්ෂයේ වීථි සංචාරය කරේ නැති නිසා ලබා දෙන මුදල සම්බන්ධව ඔබතුමාලගේ අදහස් බලාපොරොත්තු වෙනවා.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>
මේ පාර වෙනදා වගේ වීථි සංචාරය කරේ නෑ. පන්සල වටේ විතරයි ගියේ. ඒ නිසා මම යෝජනා කරනවා රුපියල් 25,000 ක් වගේ ගාණක් දුන්නම ඇති කියල.

<u>ගරු මන්ත්‍රී, රංජිත් ප්‍රනාන්දු මැතිතුමා</u>
ලබන අවුරුද්දේ 50 වෙනි සංවත්සරයට ලොකු මුදලක් දෙමු. මේ පාර සභාව පැත්තෙනුත් බලලා අඩු ගාණක් දෙමු.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එහෙනම් අපි මේ පාර රු. 50,000/-ක මුදලක් ලබා දෙමු.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම.</u>
2025 වර්ෂයේ බෙන්තොට ඓතිහාසික ගලපාත රජ මහා විහාරස්ථ ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප දළදා පූජෝපහාර පෙරහැර මංගල්‍යය සඳහා අයවැයෙන් වෙන් කරන ලද රු. 50,000/- ක මුදලක් පරිත්‍යාග කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම සංශෝධිත යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.5.6. දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ අංක දපස/ආයු/ගි 01/කාර්යාල හා 2026.01.01 දිනැතිව බෙන්තොට ප්‍රජා වෛද්‍ය ඒකකය සඳහා කාර්යාල පහසුකම් ලබා ගැනීම මැයෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි බෙන්තොට පැරණි කාර්යාල පරිශ්‍රයේ පිහිටි ඉදිරිපස ගොඩනැගිල්ලේ කොටසක් තාවකාලිකව නොමිලේ බෙන්තොට ප්‍රජා වෛද්‍ය ඒකකය පවත්වාගෙන යාම සඳහා ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
2008 වර්ෂයේ ඉඳන් ප්‍රජා වෛද්‍ය ඒකක පිහිටුවලා තියෙනවා හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම. නමුත් බෙන්තොටට තවමත් ප්‍රජා වෛද්‍ය ඒකකය පවත්වාගෙන යන්න ස්ථානයක් නැහැ..ඒකට හේතුව ඔවුන් කාර්යාලයේ රැඳී ඉන්නේ දවස් දෙකයි. අනික් දවස්වලට ගම් වලට ගිහිල්ලා වැඩසටහන් පවත්වනවා. කාලයක සිට සභාවේ තමයි ඉඳලා තියෙන්නේ. නමුත් මේ නව කාර්යාල ගොඩනැගිල්ලේ ඔවුන්ට රැඳී ඉන්න ස්ථානයක් දෙන්න ඉඩ පහසුකම් අඩුයි. දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස්තුමා පුද්ගලිකව මාව

හමුවෙලා රැඳී ඉන්න ස්ථානයක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. ඒ අය හරහා අපේ බල ප්‍රදේශයට යම් සේවාවක් සිදුවෙනවා. අපේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ ඉදිරියේ දී අපි විශාල ව්‍යාපෘතියක් සිදු කිරීමට අපේක්ෂා කරනවා. එම ව්‍යාපෘතිය සිදු කරන තෙක් ප්‍රජා වෛද්‍ය නිලධාරීට කාර්යාලය සඳහා පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක් නොමිලේ ලබාදීම සුදුසුයි. ගොඩනැගිල්ල සඳහා අවසන් තීන්දුවක් ගෙන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන තෙක් තාවකාලිකව පමණයි මෙය ලබා දෙන්නේ.

**යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

5.5.7. ගෝනගල වෙළඳපොළ සංකීර්ණයේ අංක 02 හා අංක 08 කඩ කාමර දීර්ඝකාලීන බදු පදනම මත ජී. ප්‍රකාශ් සහ පුෂ්පා චාන්දනී යන අය විසින් බදු ලබාගත් අතර විදුලිය ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා මාස්පතා ගෙවනු ලබන රුපියල් 12,000/- ක මාසික බදු මුදල ගෙවීම සම්බන්ධයෙන් සහනයක් සලසා දෙන මෙන් ඉල්ලා ඇත. මේ සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**
මේ අයට ලයිට් ගන්න බැරිවෙලා තියෙන්නේ ඒ අයගේ වරදින් නෙවෙයි. ඒ ගොඩනැගිල්ලේ වරදක් තියෙනවා. එක පැත්තකින් තමයි විදුලිය ලබාගන්න සියලු සබඳතා සකස් කරලා තියෙන්නේ. නමුත් විදුලි බල මණ්ඩලය කියනවා ඒ විදියට බෑ අනෙක් පසටත් සම්බන්ධතාවයක් සකස් කරාම තමයි කඩකාමර 05ට විදුලිය ලබාදෙන්න පුළුවන් කියලා. මේ අය එක්වන් මුදල් ලබාදීලා තියෙන්නේ. මේ අයට කඩ කාමර පවත්වාගෙන යන්න විදිහක් නැහැ විදුලිය නැති නිසා විදුලිය හැකි ඉක්මනින් ලබාදීම අපේ වගකීමක්. අපිට මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්න වෙනවා. විදුලිය නැති නිසා ඔවුන්ට ආදායමක් ලබාගෙන මාසික කුලිය ගෙවීමට හැකියාවකුත් නැහැ. මේ මාසය අවසන් වන විට එම ගැටලු විසඳාගත හැකි වෙයි. නමුත් මෙතන නීතිමය ගැටලුවක් තියනවා. කඩ කාමර ලබාගත් අනික් දෙදෙනා කුලිය ගෙවලා තියෙන්නේ. ඒ නිසා අපි ක්ෂණික තීරණයක් නොගෙන විමර්ශන නිලධාරීතුමියගෙනුත් මේ පිළිබඳ විමසලා උපදෙස් අරගෙන විදුලි බල මණ්ඩලයෙන් මේ අය ඉල්ලීම කරපු දිනයයි විදුලිබල මණ්ඩලයෙන් මේ සම්බන්ධව ලබා දීපු ලිපියක් තියෙනවා නම් ඒකයි බලලා මුදල් කමිටුවට දාලා ඉන්පසු තීන්දුවක් ගමු.

ඒ අනුව විමර්ශන නිලධාරී වෙතින් වාර්තාවක් ලබා ගෙන එම වාර්තාව මුදල් කමිටුවට යොමු කර ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය කරන ලදී.

5.5.8. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එවන ලද බිල් කිරීම් අනුව 2025 සැප්තැම්බර් මාසය අවසාන වන විට රු. 5,121,832.61 ක මුදලක් හිඟව පවතින බව දන්වා ඇති අතර මාසික වාර මුදල වන රු. 3,154.50 ක මුදල ඔක්තෝම්බර් නොවැම්බර් මාස දෙකට එකතු කළ විට රු. 5,128,141.61 ක මුදලක් මේ වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට හිඟව පවතින අතර මෙම මුදල ගෙවීම් කිරීම පිළිබඳ තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
මේ මුදල හිටපු සභාපතිවරු ගෙවලත් නෑ. අනිත් සභාවල් ගෙවලත් නෑ. මේ වෙලාවෙ මේ තරම් මුදලක් ගෙවන්න අපට හැකියාවකුත් නෑ. ඒ නිසා මෙය මේ වෙලාවේ නොගෙවා සිටිමු.

ඒ අනුව ඉදිරියේ දී මේ පිළිබඳව සලකා බැලීම සුදුසු බවට තීරණය කරන ලදී.

5.5.9. දකුණු පළාත් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ 02/2025 යටතේ අප සභාව සතු වාහන පූර්ණ රක්ෂණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා__
මේ චක්‍රලේඛය ගැන සරලව කිව්වොත් මේකේ කියල තියෙනවා සභාවේ මොන වාහනද රක්ෂණය කරන්නෙ කියලා සභාවට තීන්දුවක් ගන්න පුළුවන් කියලා. අපේ වතුර බවුසරය, ඩ්‍රම් ට්‍රක් එක, කැබ් රථ 04, ත්‍රීරෝද රථය සහ බැකෝ යන්ත්‍රය පූර්ණ රක්ෂණය කරමු.

__ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සංශෝධිත යෝජනාව ඉදිරිපත් කිරීම__
දකුණු පළාත් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ 02/2025 යටතේ අප සභාව සතු පහත අංක දරණ වාහන පූර්ණ රක්ෂණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

- අංක LL 7293 දරණ වතුර බවුසරය
- අංක LL 7067 දරණ ඩ්‍රම් ට්‍රක් රථය
- අංක PF 7388 දරණ කැබ් රථය
- අංක 252 - 6569 දරණ කැබ් රථය
- අංක LL 7603 දරණ කෘ කැබ් රථය
- අංක LD 8614 දරණ සිංගල් කැබ් රථය
- අංක ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය
- අංක JR 7724 දරණ ත්‍රීවිල් රථය

එම සංශෝධිත යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධිත යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

5.5.10. බෙන්තොට ප්‍රාදේශීය සභා මිරිස්වත්ත පියවර පෙර පාසලේ සේවයේ නියුතු පෙරපාසල් ගුරු සුමිත්‍රා මිය 2026.07.14 දින විශ්‍රාම යාමට නියමිත බැවින් උක්ත පෙරපාසලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

සඳහා සුදුසුකම් සහිත පෙරපාසල් ගුරු භවතෙකු දෛනික පදනම මත හෝ බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මේ පෙර පාසල වෙනුවෙන්ම කියලා නෙවෙයි අපි අලුත් පාලිකාවක් බඳවා ගනිමු. මොකද පුරප්පාඩුව සම්පූර්ණ නොකළොත් අපිට පෙර පාසල අහිමි වෙනවා.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>

මේ පෙරපාසල සම්බන්ධ ගැටලුව අද ඊයෙක නෙවෙයි පෙර සිටම මේ සභාවේ පවතින දෙයක්. පසුගිය සම්බන්ධීකරණ කමිටුවට මේ සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කළා නමුත් ඒ සඳහා සහභාගි වෙන්න බැරි වුන නිසා ඒ සම්බන්ධව කතා කරන්න කෙනෙක් ඉඳලා නෑ. අනාගතයේ මිරිස්වත්ත කියන්නේ ජනාකීර්ණ ප්‍රදේශයක් ඉඩම් කට්ටි කරලා විකුණලා ගෙවල් හැදිලා ජන සංඛ්‍යාව වැඩිවන ප්‍රදේශයක් ඒ අනුව දරුවන් සංඛ්‍යාවත් වැඩිවෙලා මහ විද්‍යාලයේ ඉගෙනුම ලබන දරු පිරිසත් වැඩිවෙනවා. ඒ නිසා භෞතික සම්පත් ලබා දුන්නොත් මානව සම්පත වැඩි වෙයි.

**යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

5.5.11. 2025.12.09 දිනැති මහ සභා තීරණ 5.2.13 යටතේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරන ලද හොරවල තොටුපොළ පාර දෙපස සෘජු ශ්‍රමික පදනම මත පස් දමා සංවර්ධනය කිරීම සඳහා වන රු. 221,500/- ක ඇස්තමේන්තුගත මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

හොරවල තොටුපොළ පාර මේ වන විට කොන්ක්‍රීට් දමා සංවර්ධනය කරලා තියෙන්නේ. පාර දෙපසට පස් දාන්නත් පසුගිය සභා වාරයේදී යෝජනාවක් සම්මත වුණා. නමුත් ඒ වෙලාවේ ඇස්තමේන්තුව හදලා තිබුණේ නෑ. එතන අනතුරක් වෙන්න කලින් කඩිනමින් පස් දාන්න ඕන.

**යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

5.5.12. න්‍යාය පත්‍රය සමඟ ඇමුණුම් ලෙස යොමු කරනු ලබන කාරක සභා වාර්තා මුද්‍රණයේදී A4 කොළ විශාල වශයෙන් වැයවන බැවින් මුද්‍රණ පිරිවැය අවම කර ගැනීම සඳහා එම වාර්තා මන්ත්‍රීවරුන්ගේ වට්ස් ඇප් සමූහය වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එක් වාර්තාවක් පිටපත් 23 බැගින් මුද්‍රණය කිරීම සිදුවෙනවා. මේ ඇමුණුම් ලෙස එවන වාර්තා ඊළඟ සභා වාර්තාවට නැවත ඇතුළත් වෙනවා. ඒ නිසා දෙපාරකට මුද්‍රණය කරනවාට වඩා එය සුදුසු වේවි.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>5.6. ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>

5.6.1. බෙන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා අප සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට සහභාගි වීමට හැකිවන පරිදි අවස්ථාව සලසා දෙන මෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා</u>
අවස්ථානුකූලව යම් කාලවකවානු අහිමි වුණත් මම බෙන්තර ප්‍රාදේශීය සභාවේ 2012 ඉඳන්ම ඉන්න මන්ත්‍රීවරයෙක් විදියට මම දකින දෙයක් තමයි මන්ත්‍රීවරයෙකුට ගොඩක් වැදගත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව. ප්‍රදේශයේ පවතින ගැටළු, යෝජනාවලට ඒ මොහොතේ ගන්න ක්ෂණික විසඳුම් තීරණ තමයි ඉන් ඉදිරියට ක්‍රියාත්මක වෙන්නේ. සභාපතිතුමා සහභාගි වුණාට එතුමාගේ කොට්ඨාසය හැර අනෙක් කොට්ඨාසවල පවතින ගැටලු සම්බන්ධව එතුමන් සියල්ලම දැනුවත් නැහැ. ඒ නිසා අදාළ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා සිටිය යුතුයි ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට. තවත් ඉස්සරහට එන ගැටලුවක් තමයි ප්‍රජා කමිටු. මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් දොළොස් දෙනෙක් පමණයි මම දන්න විදියට ප්‍රජා කමිටු නියෝජනය කරන්නේ. සාමාන්‍යයෙන් ගමේ සිටින මහජන නියෝජිතයා ප්‍රජා කමිටුවේ අනිවාර්ය සාමාජිකයෙක් වෙනවා. මින් පෙර සම්බන්ධීකරණ කමිටුවට ගෙනාවේ ප්‍රජා කමිටුවල තීරණ.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වීමට අදාළ චක්‍රලේඛය පරිදි සඳහන් වෙන්නේ පාලක පක්ෂය නියෝජනය කරන දෙදෙනෙක් හා විපක්ෂය නියෝජනය කරන දෙදෙනෙක් කියලා. නමුත් ප්‍රාදේශීය සභාවල පාලක පක්ෂයක් සහ විපක්ෂයක් නෑ. සිටින්නේ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු පිරිස පමණයි. එහි කිසිම පක්ෂ භේදයක් නැහැ. අපි මේ යෝජනාව සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා වන නිශාන්ත පෙරේරා මැතිතුමාට, ලේකම්වරයා විදියට ප්‍රාදේශීය ලේකම්තුමාට ඒ වගේම දිස්ත්‍රික් ලේකම්තුමා වන නලින් හේවගේ මහතාට දැනුම් දීමක් කරමු.

ඒ අනුව බෙන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා අප සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට සහභාගි වීමට හැකිවන පරිදි අවස්ථාව සලසා දෙන ලෙස සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා වන නිශාන්ත

පෙරේරා මැතිතුමාට, ලේකම්වරයා වන ප්‍රාදේශීය ලේකම්තුමාට හා දිස්ත්‍රික් ලේකම්තුමා වන නලීන් හේවගේ මහතාට ලිඛිතව මේ පිළිබඳ දන්වා යැවීමට තීරණය කරන ලදී.

**<u>5.7. ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>**

5.7.1. 2025.09.16 දිනැති මහ සභා තීරණ (ඊ)(10)(3) යටතේ සංවර්ධනය කිරීමට යෝජනා වූ ඇතුන්ගාගොඩ හොරගොඩවත්ත පාර ඇතුනගාගොඩ කොරමිල්ලවත්ත පාර ලෙස සංශෝධනය විය යුතු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>5.8. ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>**

5.8.1. බෙන්තොට පිටාරඹ පන්සල පසුකර වමට ඇති මාර්ගයේ රාජපක්ෂ මහතාගේ නිවස ඉදිරිපස පසුකර ඉදිරියට ඇති මීටර් 200 ක් පමණ මාර්ගය කොන්ක්‍රීට් අතුරා දෙන මෙන් ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේදී ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>

ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ පාර භාගෙට කොන්ක්‍රීට් කරලා නතර කරලා තියෙනවා. එතනින් එහාට පල්ලමක් තියෙන්නේ ඉහළින් එන වතුර පාරට එම පල්ලම යටවෙනවා සහ එතන ලොකු භූමි ප්‍රමාණයක් තියෙනවා කැලේට ගිහිල්ලා. ඒකේ සංචාරක හෝටලයක් ඉදි කරන්න ඉදිරිපත් උනත් ඒ කෙනා පසුබට වෙනවා එතැනට පහසුකම් නෑ කියලා. බෙන්තරට ලැබෙන්න තියෙන ආයෝජනයක් නැතිවෙලා යන හින්දා කඩිනමින් සකස් කරලා දෙන්න කියලා ඉල්ලනවා.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ඔබතුමියගේ ඉල්ලීම වගේම ලොකු සංදේශයක් වගේ එකක් මට බාර දුන්නා ප්‍රදේශවාසීන්. මම ඔවුන් දැනුවත් කළා මේ අවුරුද්දේ මුල් මාස හය තුළ ඒ සඳහා මුදල් වෙන් කරන්න හැකියාවක් නැති බව. නමුත් තාක්ෂණ සේවා නිලධාරි මහතාව මම යොමු කරලා කොරිපස් හරි ABC හරි දාලා යන්න පුළුවන් වෙන විදියට හදලා දෙන්නම්. මේ අවුරුද්ද අවසානය වන විට මුදල් ලැබුණොතින් ඔබතුමියගේ යෝජනාව ක්‍රියාත්මක කරන්නම්.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

මෙම අවස්ථාවේ දී ප.ව. 12.05 ට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය ගරු සභාවෙන් පිටව යන ලදී.

**5.9. ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී නොමැති යෝජනා:-**

5.9.1. හොරවල ප්‍රදේශයේ නිවාස පහළොවකට වැඩි ප්‍රමාණයක් සඳහා උග්‍ර ජල ප්‍රශ්නයක් ඇත. ඒ සඳහා ජල ව්‍යාපෘතියක් ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලද අතර එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමා වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා
මම මේක විශේෂ අවස්ථාවක් කර ගන්නවා ස්තුති කරන්න එම ප්‍රදේශයේ පසුගිය දිනක සභාවට අයත් ළිඳක් පිරිසකර කරා. ඒ ළිඳේ වතුරේ වල Ph අගය පරීක්ෂා කරලා බලලා බීමට සුදුසුද කියල බලල ජල ව්‍යාපෘතියක් එහි ආරම්භ කරන්න කියලා මම ඉල්ලනවා. එතෙක් කැමති කෙනෙක් ඉන්නවා සභාවෙන් ජල ටැංකියක් ලබා දෙනවා නම් එම ටැංකිය තියන්න ඉඩම් කොටසක් ලබා දෙන්න කැමති.

මෙම අවස්ථාවේ දී ප.ව. 12.15 ට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය ගරු සභාවෙන් පිටව යන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

මෙම අවස්ථාවේ දී ප.ව. 12.25 ට ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදී.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2025.12.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

## 2025.12.02 දින පෙ.ව.9.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් නිර්දේශ කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 32 | පී.ඩී.දීපා ප්‍රියංගනී කුමාරි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,548.00 |
| 02 | 33 | කසුන් උදාර | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 754.00 |
| 03 | 34 | කේ.එල්.සී.සෙව්වන්දි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,440.00 |
| 04 | 35 | කේ.එල්.සී.සෙව්වන්දි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 960.00 |
| 05 | 36 | ඒ.පී.ජේ.සී.අබේසූරිය | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,955.52 |
| 06 | 37 | කේ.එල්.සී.සෙව්වන්දි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 480.00 |
| 07 | 38 | ආර්.ජේ.එස්.මාදුවාගොඩ | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,044.00 |
| 08 | 53 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර 05 ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 82,960.00 |
| 09 | 61 | Induruwa Tyre House (PVT) LTD | LL 7293 දරණ ජල බවුසරයේ පිටුපස රෝදය නව ටියුබයක් යොදා අලුත්වැඩියා කිරීමට අදාළ බිල්පත පියවීම. | 9,000.00 |
| 10 | 31 | Nimra Media House | ආදායම් අංශයට අවශ්‍ය විනිග්‍රහ බලපත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 4,750.00 |
| 11 | 51 | ලංකා විදුලිබල මණ්ඩලය | හබුරුගල උපකාර්යාලයේ විදුලි බිල පියවීම. 2025.10.26 – 2025.11.23 | 2,794.87 |
| 12 | 50 | ලංකා විදුලිබල මණ්ඩලය | ඉඳුරුව උපකාර්යාලයේ විදුලි බිල පියවීම. 2025.10.14 – 2025.11.16 | 3,230.77 |
| 13 | 49 | ලංකා විදුලිබල මණ්ඩලය | ඉඳුරුව පෙර පාසලේ විදුලි බිල පියවීම. 2025.10.14 – 2025.11.16 | 666.67 |
| 14 | 44 | මුදල් භාරකරු පී.එච්.ටී.කේ. හේමචන්ද්‍ර | පෙර පාසල් වර්ෂාවසාන ප්‍රසංගයට අදාළ ද්‍රව්‍ය හා සේවා සැපයීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 62,000.00 |
| 15 | 43 | මුදල් භාරකරු එම්.ඩී.එම්.දුලංජල | යාලෙගම මිරිස්වත්ත මාර්ගයේ යාලෙගමට හැරෙන මාර්ගයේ සපත්තු කාණුවක් ඉදිකිරීම සඳහා අවශ්‍ය උපකරණ කුලී පදනම මත ලබාගැනීම වෙනුවෙන් අත්තිකාරම් ලබාගැනීම. | 16,900.00 |
| 16 | 48 | ලංකා විදුලිබල මණ්ඩලය | ප්‍රධාන කාර්යාලයේ,කාර්යාල පරිශ්‍රයේ හා වැඩ ඒකකයේ විදුලි බිල පියවීම.<br>2025.10.29 – 2025.11.29<br>2025.10.30 – 2025.11.29 | 16,742.57 |
| 17 | 42 | මුදල් භාරකරු කේ.ඕ.වී.කේ.රවි | කසල අංගනය සඳහා අවශ්‍ය පොහොර උර 50 ක් අත්පිට මුදලින් ලබාගැනීම වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණය කිරීම. | 3,750.00 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | 54 | සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | පුස්තකාල සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය/කාඩ්පත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 88,000.00 |
| 19 | 64 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැපයුම්කරුවෙකු විසින් එවන ලද චෙක්පතක් අඟරුවීම වෙනුවෙන් අයකරන ලද ගාස්තුව ගෙවීම. | 3,100.00 |
| 20 | 57 | රෙජිස්ට්‍රාර් ජනරාල් | 2023 වර්ෂයට අදාළව මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම. | 5,000.00 |
| 21 | 47 | ලංකා විදුලිබල මණ්ඩලය | බෙන්තොට මහජන පුස්තකාලයේ,කඩකාමර කොරිඩෝවේ විදුලි බිල පියවීම.<br>2025.10.29 – 2025.11.27 | 2,205.13 |
| 22 | 46 | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ප්‍රධාන කාර්යාලයේ ජල බිල පියවීම.<br>2025.10.24 – 2025.11.23 | 5,428.00 |
| 23 | 58 | රෙජිස්ට්‍රාර් ජනරාල් | 2024 වර්ෂයට අදාළව මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල දීමනා ගෙවීම. | 5,300.00 |
| 24 | 41 | මුදල් භාරකරු ආර්.ජේ.එස්.මාදුවාගොඩ | නිවාඩු දින වැටුප් ගෙවීම. 2025.11.01,2025.11.02,2025.11.05,2025.11.08,2025.11.09 | 12,443.33 |
| 25 | 39 | එම්.ඒ.සංජය ජයසිංහ | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 9,000.00 |
| 26 | 52 | සභාපති, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | RX 0099 ගලි බවුසරයෙන් ලබාගන්නා මල අපද්‍රව්‍ය වාර 17 ක් බැහැරලීම වෙනුවෙන් ගෙවීම. | 51,000.00 |
| 27 | 62 | ලංකා බැංකුවේ කේ.ඒ.මධුරි චන්දිමාලා ගි.අ.6609558 | 2026 වර්ෂය සඳහා බෙන්තොට පොදු වෙළඳපොළ කඩකාමර බදුදීමේදී අංක 04 කඩකාමරය සඳහා ටෙන්ඩර් ලබාගැනීමේදී තැන්පත් කල ආරක්ෂිත ඇප තැන්පත් මුදල ආපසු ගෙවීම. | 5,000.00 |
| 28 | 59 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම. 2025.11.01 - 2025.11.13 | 130,744.00 |
| 29 | 60 | A.M. Enterprises (PVT) LTD | PF 7388 දරණ කැබ් රථයේ පූර්ණ සේවාව සිදුකිරීමට අදාළ බිල්පත් පියවීම. | 59,310.00 |
| 30 | 55 | Sell – X Computers | බෙන්තොට ප්‍රාදේශීය සභාවට නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 44,000.00 |
| 31 | 63 | ලංකා බැංකුවේ කේ. හර්ෂිකා උදේනි සිල්වා ගි.අ. 79901691 | 2026 වර්ෂය සඳහා බෙන්තොට පොදු වෙළඳපොළ කඩකාමර බදුදීමේදී අංක 03 කඩකාමරය සඳහා ටෙන්ඩර් ලබාගැනීමේදී තැන්පත් කල ආරක්ෂිත ඇප තැන්පත් මුදල ආපසු ගෙවීම. | 5,000.00 |
| 32 | 56 | F.H. Tools Center | සභාව සතු ගස් කපන මැෂිම සඳහා අවශ්‍ය චේන් 01 ක් සහ තල මුවත් තබන පීරක් මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 5,500.00 |
| 33 | 17 | මුදල් භාරකරු ලේකම්,බෙන්තොට ප්‍රාදේශීය සභාව | හදිසි ආපදා සහන සේවා සඳහා ගම්පොළ ප්‍රදේශයට යාමට අවශ්‍ය සංග්‍රහ වියදම් හා අනෙකුත් වියදම් සඳහා අත්තිකාරම් ලබාගැනීම. | 100,000.00 |
| 34 | 18 | බී.මහේෂ් පුබුදු | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රදාන ගෙවීම. | 54,193.79 |

01. පිටු අංක 116 සිට 118 දක්වා වූ අංක 01 සිට 34 දක්වා වන වවුචර් පරීක්ෂා කොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

02. 2025.11.27 දිනැතිව "අත්තිකාරම් මුදල් ලබාගැනීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවට අයත් RD 6208,RX 0099,PF 7388,252-6569 යන වාහනවල ආදායම් බලපත්‍ර,දුම් පරීක්ෂණ සහතික ලබාගත යුතුව ඇති බවත් ඒ සඳහා රු.30,880.00 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදෙන ලෙසත් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව උක්ත සඳහන් වාහනවල ආදායම් බලපත්‍ර,දුම් පරීක්ෂණ සහතික ලබාගැනීම සඳහා රු.30,880.00 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

03. 2025.12.02 දිනැතිව "ආපදා සහන සැලසීම සඳහා ගම්පොළ ප්‍රදේශයට යාම සඳහා අත්තිකාරම් ලබාගැනීම" යන මැයෙන් යුතුව ලේකම් මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මේ වන විට රටේ පවතින ආපදා තත්ත්වයට සහන සැලසීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි මහනුවර දිස්ත්‍රික්කය ලබාදී ඇති අතර මේ යටතේ බෙන්තොට ප්‍රාදේශීය සභාව ගම්පොළ ප්‍රදේශයට යාමට නියමිත බැවින් මේ සඳහා සහභාගී වීමට නියමිත 50 කට ආසන්න පිරිසට සංග්‍රහ වියදම් හා අනෙකුත් අවශ්‍ය විය හැකි හදිසි වියදම් සඳහා රු.200,000.00 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් කාරණාව සඳහා රු.200,000.00 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

04. 2025.12.01 දිනැතිව "252-6569 කැබ් රථයේ වාර සේවාව සිදුකිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 252-6569 දරණ කැබ් රථය අවසන්වරට වාර සේවාව සිදුකර 5000 km ඉක්මවා ධාවනය කර ඇති බැවින් මෙම රථයේ වාර සේවාව Induruwa Car Care Service ආයතනය වෙත යොමුකර සිදුකර ගැනීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත.ඒ අනුව උක්ත සඳහන් කැබ් රථයේ වාර සේවාව සභාවේ අනුමත Induruwa Car Care Service ආයතනයෙන් සිදුකර ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

05. 2025.12.01 දිනැතිව "පෙර පාසල් ගුරුවරුන් සඳහා 2025 වර්ෂය වෙනුවෙන් නිල ඇඳුම් ලබාගැනීම" යන මැයෙන් යුතුව බෙන්තොට ප්‍රාදේශීය සභා පෙර පාසල් ගුරුවරුන් විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව චක්‍රලේඛය ප්‍රකාරව 2025 වර්ෂයට හිමි නිල ඇඳුම් සාරි ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව 2026 වර්ෂයේ මුල් කාලසීමාවේදී පෙර පාසල් ගුරුවරුන්ට හිමි නිල ඇඳුම් සාරි ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

06. 2025.12.01 දිනැතිව "ලේඛනාගාරය සඳහා රාක්ක සකස් කිරීම" යන මැයෙන් යුතුව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයට ඉහළින් පිහිටා ඇති ගබඩා කාමරය ලේඛනාගාරය වශයෙන් භාවිත කිරීම සඳහා රාක්ක සකස් කර ගත යුතුව ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශයට ඉහළින් පිහිටා ඇති ගබඩා කාමරය ලේඛනාගාරය වශයෙන් භාවිත කිරීම සඳහා රාක්ක සකස් කර ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

07. 2025.12.01 දිනැතිව සං/06 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමේදී ගලවා ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය සහ දැනට බෙන්තොට ප්‍රාදේශීය සභා පැරණි කාර්යාලයේ රඳවා තබා ඇති අබලි ද්‍රව්‍ය සමීක්ෂණ මණ්ඩලයක් හරහා සමීක්ෂණය කොට සමීක්ෂණ වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර එම සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළව වෙන්දේසි කළ යුතු භාණ්ඩ, තක්සේරු මණ්ඩලයක් හරහා තක්සේරු කරන ලද අතර එම තක්සේරු වාර්තාව අනුමැතිය සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව උක්ත තක්සේරු වාර්තාව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

08. 2025.11.10 දිනැතිව "වැසිකිලි ආධාර ලබාගැනීම සඳහා " යන මැයෙන් යුතුව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව හබුරුගල,වියන්දූව,කැබැල්ලකන්ද පදිංචි ඩබ්.කේ.දේවිකා නුවන් කුමාරි මිය විසින් 2025.08.25 දිනැතිව වැසිකිලි ආධාර ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්තියේ xxiii ප්‍රකාරව බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සනීපාරක්ෂාව ඉහළ නැංවීමේ අරමුණින් වැසිකිළි පහසුකම් ලබාදීමේදී පහත සඳහන් නිර්ණායක සලකා බැලිය යුතු බව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

- අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරි සහතික කල යුතුය.
- තාක්ෂණ සේවා නිලධාරි විසින් සිදුකරන ස්ථාන පරීක්ෂාවේදී සත්‍ය වශයෙන්ම වැසිකිළියක් නොමැති බව තහවුරු විය යුතුය.
- පාසල් යන දරුවන් සිටීම.
- ගෘහ මූලිකයා නොමැති වීම.

09. 2025.12.01 දිනැතිව "මිශ්‍ර ආදායම් ලිපිකරුගේ පරිගණකය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මිශ්‍ර ආදායම් ලිපිකරු භාවිතා කරන පරිගණකය අක්‍රීය තත්ත්වයේ පැවතීම හේතුවෙන් එය අලුත්වැඩියා කිරීම සඳහා දකුණු පළාත් වාරිමාර්ග කාර්යාලයේ පරිගණක අලුත්වැඩියා ඒකකය වෙත යොමුකරන ලදුව ඒ අනුව අදාළ ආයතනයෙන් මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා රු.74,630.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා අනුමැතිය ඉල්ලා ඇත.ඒ අනුව උක්ත සඳහන් පරිගණකය අලුත්වැඩියාව සඳහා වැඩි කොටස් ප්‍රමාණයක් දැමීමට සිදුවන බැවින් ඒ සඳහා වියදම් දැරීමට වඩා නව පරිගණකයක් මිලදී ගැනීම සුදුසු බවට තාක්ෂණ සේවා නිලධාරි විසින් නිර්දේශ කර ඇති බැවින් නව පරිගණකයක් මිලදී ගැනීම සුදුසු බවට තාක්ෂණ සේවා නිලධාරි විසින් නිර්දේශ කර ඇති බැවින් නව පරිගණකයක් මිලදී ගැනීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

10. 2025.11.24 දිනැතිව "පුටු ලබා ගැනීම හා සම්බන්ධවයි" යන මැයෙන් යුතුව පහත නම් සඳහන් නිලධාරින් විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කාර්යාලයේ ඔවුන් දැනට භාවිතා කරනු ලබන කාර්යාලීය පුටු අබලන්ව ඇති බැවින් පහසුවෙන් රාජකාරි කිරීමට ලිපිකරු පුටු ලබාදෙන මෙන් කර තිබෙන ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

I. කේ.ඒ.ප්‍රභා මධුෂානි - සංවර්ධන නිලධාරි
II. කේ.එල්.සී.සෙව්වන්දි - කළමනාකරණ සේවා නිලධාරි

| | | |
|---|---|---|
| III. | ඒ.එම්.ටී.එස්.අමරසිංහ | - සංවර්ධන නිලධාරි |
| IV. | ඒ.සී.චන්ද්‍රානි | - ප්‍රජා සංවර්ධන නිලධාරි |
| V. | ආර්.එන්.ජී.ආරච්චි | - සංවර්ධන නිලධාරි |
| VI. | එම්.ඒ.එස්.දර්ශනි | - සංවර්ධන නිලධාරි |
| VII. | දීපා ප්‍රියංගනි | - සංවර්ධන නිලධාරි |
| VIII. | එන්.ටී.ඒ.ජේ.ද සිල්වා | - සංවර්ධන නිලධාරි |
| IX. | සී.අයි.ඩී.ඒ.වීරසේකර | - කළමනාකරණ සේවා නිලධාරි |
| X. | එම්.ඩී.එම්.දුලංජල | - කළමනාකරණ සේවා නිලධාරි |

11. 2025.12.02 දිනැතිව "දොර දෙකේ වානේ කබඩ් එකක් ඉල්ලුම් කිරීම" යන මැයෙන් යුතුව ආදා/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව වරිපනම් විෂය සඳහා ඇති ලිපි ලේඛන ගබඩා කිරීම සඳහා දොර දෙකේ වානේ කබඩ් එකක් ලබා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් විෂයභාර නිලධාරිනිය සඳහා දොර දෙකේ වානේ කබඩ් එකක් ලබා දීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

12. 2025.12.02 දිනැතිව "දොර දෙකේ වානේ කබඩ් එකක් ලබා ගැනීම" යන මැයෙන් යුතුව ගි/09 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහු දැනට භාවිතා කරනු ලබන කබඩ් එක සං/01 විෂයට අයත් කබඩ් එකක් බැවින් එම විෂයේ ලිපිගොනු පිරී පවතින බැවින් දැනට භාවිතා කරනු ලබන කබඩ් එක සං/01 විෂයට දීමට සිදුවන බැවින් ගි/09 විෂයට නව කබඩ් එකක් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

13. 2025.11.26 දිනැතිව "හබුරුගල ආයුර්වේද මධ්‍යස්ථානයට ඖෂධ මිලදී ගැනීම" යන මැයෙන් යුතුව ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යන හබුරුගල ආයුර්වේද මධ්‍යස්ථානයේ ඉදිරි ප්‍රතිකාර කටයුතු සඳහා රු.115,310.00ක වටිනාකමකින් යුත් ඖෂධ ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් ඖෂධ වට්ටෝරු හබුරුගල නිදහස් ආයුර්වේදය සඳහා ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

14. 2025.12.01 දිනැතිව "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත ප්‍රදාන,ඝන අපද්‍රව්‍ය කළමනාකරණය - නව වැඩ" යන මැයෙන් යුතුව සං/03 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රතිපාදන අනුමතව ඇති නොදිරන අපද්‍රව්‍ය රැස්කිරීම හා කළමනාකරණය සිදුකරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන්කිරීම සඳහා රු.මිලියන 0.85ක ප්‍රතිපාදන අනුමතව ඇති අතර ව්‍යාපෘතිය සඳහා තාක්ෂණ සේවා නිලධාරි විසින් සකසන ලද රු.1132,086.01ක් වූ ඇස්තමේන්තුව ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් ව්‍යාපෘතිය 2025.12.31ට පෙර අවසන් කර බිල්පත් ඉදිරිපත් කළයුතු බැවින් සභා අනුමැතියට යටත්ව කඩිනමින් සිදු කිරීමටත් අනුමත ප්‍රතිපාදනවලට අමතරව මුදලක් වැයවේ නම් සභා අරමුදලින් දැරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

15. 2025.12.01 දිනැතිව "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන,කනහෙන්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබාදීම සඳහා නල එලීම" යන මැයෙන් යුතුව සං/03 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 0.80ක ප්‍රතිපාදන අනුමතව ඇති අතර ඒ සඳහා තාක්ෂණ

සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු.800,000.00ක් වූ ඇස්තමේන්තුව ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.ඒ අනුව උක්ත සඳහන් ව්‍යාපෘතිය 2025.12.31ට පෙර අවසන් කර බිල්පත් ඉදිරිපත් කළයුතු බැවින් සහා අනුමැතියට යටත්ව කඩිනමින් සිදු කිරීමටත් අනුමත ප්‍රතිපාදනවලට අමතරව මුදලක් වැයවේ නම් සභා අරමුදලින් දැරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

16. 2025.11.25 දිනැතිව අංක 3/2/සන අපද්‍රව්‍ය/බෙන්තොට දරණ "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය - නව වැඩ" යන මැයෙන් යුතුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත සංවර්ධන සැලැස්ම යටතේ නොදිරන අපද්‍රව්‍ය රැස්කිරීම හා කළමනාකරණය සිදුකරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන්කිරීම සඳහා රු.මිලියන 0.85ක ප්‍රතිපාදන අනුමත වී ඇති බවත් උක්ත ව්‍යාපෘතිය කඩිනමින් සිදුකර 2025.12.20 දිනට පෙර බිල්පත් ඉදිරිපත් කලයුතු බවත් දන්වා ඇත.ඒ අනුව උක්ත ව්‍යාපෘතිය කඩිනමින් සහා අනුමැතියට යටත්ව සිදු කිරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

17. 2025.11.25 දිනැතිව අංක 3/8/ප්‍ර.ජ/බෙන්තොට දරණ "දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන" යන මැයෙන් යුතුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන),පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත සංවර්ධන සැලැස්ම යටතේ කනහෙන්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබාදීම සඳහා නල එලීමට රු.මිලියන 0.80ක ප්‍රතිපාදන අනුමත වී ඇති බවත් උක්ත ව්‍යාපෘතිය කඩිනමින් සිදුකර 2025.12.20 දිනට පෙර බිල්පත් ඉදිරිපත් කළයුතු බවත් දන්වා ඇත.ඒ අනුව උක්ත ව්‍යාපෘතිය කඩිනමින් සහා අනුමැතියට යටත්ව සිදු කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

18. 2025.12.01 දිනැතිව "PF 7388 කැබ්රථය පූර්ණ රක්ෂණය සිදුකිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාවට අයත් PF 7388 කැබ්රථය 2025/2026 වර්ෂය සඳහා පූර්ණ රක්ෂණය සිදුකිරීමට අවශය අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ අනුව උක්ත කැබ්රථය 2025/2026 වර්ෂය සඳහා පූර්ණ රක්ෂණය සිදු කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදි.

| | | |
|---|---|---|
| 1) ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 2) මිගාර වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 3) ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4) නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

2025.12.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2025.12.02 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2025/11/28 දින පෙ.ව. 09.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දි පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රසම්පාදන කමිටුව රටේ පැවති හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් එදින රජයේ විශේෂ නිවාඩු දිනයක් කල බැවින් එම කමිටුව 2025/12/02 දින පෙ.ව. 09.00 ට රැස්වූ අතර ඊට අදාළ රැස්වීමේ පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. කේ.ඩී.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

**<u>01.බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ගෝනගල හා මහ ඉඳුරුව සතිපොළ 2025 ජනවාරි 01 සිට 2026 දෙසැම්බර් 31 දින දක්වා බදු මුදල් එකතු කිරීමේ අයිතිය බදු දීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/12 සිට 2025/11/28 දක්වා

බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ගෝනගල හා මහ ඉඳුරුව සතිපොළ 2026/01/01 සිට 2026/12/31 දින දක්වා බදු මුදල් එකතු කිරීමේ අයිතිය බදු දීම සඳහා 2025/11/12 දින පෙ.ව 09.00 සිට 2025/11/27 ප.ව.03.00 දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කල අතර 2025/12/28 පෙ.ව. 10.30 දක්වා භාරගත් ටෙන්ඩර් එදින පෙ.ව. 10.30 ට විවෘත කිරීමට තිබූ නමුත් රටේ පැවති හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් එදින රජයේ විශේශ නිවාඩු දිනයක් කළ බැවින් ටෙන්ඩර් විවෘත කිරීම 2025/12/02 පෙ.ව.9.00 ට සිදු කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අත්සන් තබන ලදි. ඒ අනුව මුද්‍රා තබන ලද අයදුම්පත් 01 බැගින් ලැබී තිබුනි.

| අනු අංකය | වෙළඳාමේ ස්භාවය | පෝරම ගාස්තු(රු)<br>ආපසු නොගෙවන | ටෙන්ඩර් තැන්පත් මුදල(රු)<br>ආපසු ගෙවන | අවම ලංසුව(රු) |
|---|---|---|---|---|
| 01 | ගෝනගල සතිපොළ බදු මුදල් එකතු කිරීමේ අයිතිය බදු දීම | රු.500.00 | රු.2,500.00 | රු.100,000.00 |
| 02 | මහ ඉඳුරුව සතිපොළ බදු මුදල් එකතු කිරීමේ අයිතිය බදු දීම | රු.500.00 | රු.2,500.00 | රු.35,000.00 |

| අනු අංකය | ටෙන්ඩර් කරන ලද සතිපොළ | ටෙන්ඩර්කරුගේ නම, ජා.හැ.අංකය | ටෙන්ඩර්කරුගේ ලිපිනය | ඉදිරිපත් කර ඇති වාර්ෂික ටෙන්ඩර් මුදල(රු) |
|---|---|---|---|---|
| 01 | අඟහරුවාදා ගෝනගල සතිපොළ | කේ.ඩී.කේ.සී.ජී. කාරියවසම් මයා<br>602741109V | "ශාන්ති" ඔබඩවත්ත,<br>බෙන්තොට. | 100,200.00 |
| 02 | සෙනසුරාදා මහ ඉදුරුව සතිපොළ | කේ.ඩී.කේ.සී.ජී. කාරියවසම් මයා<br>602741109V | "ශාන්ති" ඔබඩවත්ත,<br>බෙන්තොට. | 35,200.00 |

ඒ අනුව, අඟහරුවාදා ගෝනගල සතිපොළ සහ සෙනසුරාදා මහ ඉදුරුව සතිපොළ බදු මුදල් එකතු කිරීමේ අයිතිය බදු දීම සඳහා "ශාන්ති" ඔබඩවත්ත, බෙන්තොට. ලිපිනයේ පදිංචි ජා.හැ.අංක 602741109V දරණ කේ.ඩී.කේ.සී.ජී. කාරියවසම් මයා පමණක් අයදුම්පත් ඉදිරිපත් කර තිබුනි. ඔහු විසින් ඒ සඳහා වන ලංසු මුදල ඉක්මවා මිල ඉදිරිපත් කර තිබූ අතර පිළිවෙලින් ගෝනගල සතිපොළ සඳහා රු. 100,200.00 ක මුදලක්ද, මහ ඉදුරුව සතිපොළ සඳහා රු. 35,200.00ක වාර්ෂික ටෙන්ඩර් මුදලක් ඉදිරිපත් කර තිබුනි. ඒබැවින් 2026.01.01 සිට 2026.12.31 දින දක්වා එම සතිපොළ වල බදු මුදල් එකතු කිරීමේ අයිතිය.ඩී.කේ.සී.ජී. කාරියවසම් මයා වෙත ලබා දීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>02.හොරවල දෙද්දුවගෙවත්ත අද්දරවෙල පොදු ළිඳ සෘජු ශ්‍රමය යටතේ ප්‍රතිසංස්කරණය කරවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/12 සිට 2025/11/28 දක්වා

| අනු අංකය | අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|---|---|
| | | | සේනානායක හාඩ්වෙයාර් ඇලකාකා, හබුරුගල. ඒකකයක මිල (රු) | සුහන්සා හාඩ්වෙයාර්, හබුරුගල, බෙන්තොට ඒකකයක මිල (රු) | පෙරේරා හාඩ්වෙයාර්, වරකමුල්ල, මහ ඉදුරුව. ඒකකයක මිල (රු) |
| 1 | සිමෙන්ති | කොට්ට 12 | 1,750.00(ලංවා) | 1,750.00(ලංවා) | 1750.00(සමුද්‍රා) |
| 2 | වැලි(සාමාන්‍ය) | කියුබ් ½ | 13,000.00 | 12,000.00 | 12,000.00 |
| 3 | ¾ කොන්ක්‍රීට් ගල් | කියුබ් ½ | 7,500.00 | 6,500.00 | 6,500.00 |
| 4 | 1" කොන්ක්‍රීට් ගල් | කියුබ් ½ | 7,500.00 | 6,500.00 | 6,500.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | ප්‍රවාහන ගාස්තු | - | - | - | 5,000.00 |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව අයිතම අංක 01 සිට 05 දක්වා වූ අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ හබුරුගල, සුහන්සා හාඩ්වෙයාර් වෙතින් ලංවා සිමෙන්ති කොට්ටයක් රු. 1,750.00 බැගින් කොට්ට 12ක්, රු. 12,000.00 බැගින් වැලි කියුබ් ½ ක්, රු. 6,500.00 බැගින් ¾ කොන්ක්‍රීට් ගල් කියුබ් ½ හා 1" කොන්ක්‍රීට් ගල් කියුබ් ½ බැගින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තිරණය කරන ලදි.

**<u>03.වයර් රහිත FM මයික් මිලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණණ කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| ද්‍රව්‍ය අයිතමය පිළිබඳ විස්තරවය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | | |
|---|---|---|---|---|
| | Robert Agenices (pvt) ltd Colombo 11 | STC - Matara | E-Net Office Automation(pvt) ltd, Galle | Southnet Technolge (pvt)ltd, Galle |
| වයර් රහිත fm මයික් 06 | 28,800.00<br><br>Ahuja<br>01 year warranty | 31,000.00<br><br>Sound king<br>W18RA<br>6month warranty | 31,000.00<br><br>Ahuja<br>01 year warranty | 46,500.00<br><br>Sennheiser<br>6 month warranty |

ලියාපදිංචි ආයතන 04ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සමඟ අදාල ආයතන විසින් ඉදිරිපත් කර තිබූ පිරිවිතරයන් පරීක්ෂා කර බැලූ කමිටුව අදාල මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Colombo 11, N.H.M.Abdul Cader road, no 88 ලිපිනයේ පිහිටි Robert Agenices (pvt) ltd ආයතනය වෙතින් වසරක වගකීමක් සහිතව Ahuja වර්ගයේ fm මයික් 01ක් වැට් සහිතව රු. 28,800.00 බැගින් මයික් 02 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>04.නවීකරණය කරන ලද ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ගල් පතුරු අල්ලන ලද කොටසේ සුදු යකඩ අකුරෙන් සභාවේ නම භාෂා ත්‍රිත්වයෙන් සහ සභා ලාංඡනය ප්‍රදර්ශනය කිරිම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| ද්‍රව්‍ය අයිතමය පිළිබඳ විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | Screen Solution no28, main street, Moratuwa. | Samara Plastic Graphics, no 28 Kularathne road, Ambalangoda. | LC Printers & Advatising(pvt)ltd Massala, Beruwala |
| භාෂා ත්‍රිත්වයෙන් සභාවේ නම සහ සභා ලාංඡනය සුදු යකඩ අකුරෙන් නිමවා | සිංහල අකුරු 12"<br>දෙමළ අකරු 06" | සිංහල අකුරු 12"<br>දෙමළ අකරු 7.5" | |

| | | | |
|---|---|---|---|
| ගල්පතුරු අල්ලන ලද අඩි 15 × 15 බිත්ති කොටසේ සවි කිරීම | ඉංග්‍රිසි අංකුරු 06" ලාංඡනය 18"<br><br>රු. 320,000.00<br><br>(වගකීම - මාස 06) | ඉංග්‍රිසි අංකුරු 6.75" ලාංඡනය 18"<br><br>රු. 320,000.00 | රු. 460,000.00 |

මේ සඳහා ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම ආයතන විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන්හි ඇතුළත් අකුරුවල ප්‍රමාණයන් මත වඩා ඵලදායි මෙන්ම ලාභදායිත්වය අනුව මිල ගණන් ඉදිරිපත් කර තිබූ අම්බලන්ගොඩ, කුලරත්න පාර, නො.28 පිහිටි Samara Plastic Graphics ආයතනය වෙතින් වැඩ කුළිය ද සහිතව සම්පූර්ණ වටිනාකම රු. 347,570.00ක මුදලකට අදාල කටයුතු සිදු කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>05.2026 වර්ෂයේ සභාවේ අයවැය ලේඛනය සැකසීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අනු අංකය | අවශ්‍ය අයිතමය පිළබඳ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | |
|---|---|---|---|---|---|
| | | | Nimra Media House Aluthgama | Shashila Book Shop Aluthgama | Chamara Book Shop Ambalangoda |
| 1 | A4 Ivory Color | 150 | 8/- | 6/53 | 6/- |
| 2 | A4 Black Cover sheet | 40 | 40/- | 35/- | 47/- |
| 3 | A4 Transparent Sheet | 40 | 40/- | 35/- | 38/- |
| 4 | 2" Binding Tape | 03 | 300/- | 289/- | 460/- |
| 5 | A4 color printout Doble side | 160 pages | 80/- | 100/- | - |
| 6 | A4 Laser Color printout one side | 40 | 80/- | 50/- | - |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව අංක 01 සිට 04 දක්වා වූ අයිතමයන් සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ අළුත්ගම Shashila Book Shop ආයතනයෙන් A4 Ivory Color කොළයක් රු. 6/53 බැගින් කොළ 150ක්, A4 Black Cover sheet හා A4Transparent Sheet එකක් රු. 40/- බැගින් එම වර්ග 2න් කොළ 80ක් හා 2" Binding Tape එකක් රු.289/- බැගින් tape 03ක් මිලදී ගැනීමටත්,

අයිතම අංක 05,06 සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ අළුත්ගම Nimra Media House වෙතින් A4 color printout Doble side කොළයක් රු. 80/- බැගින් කොළ 160ක් හා A4 Laser Color printout one side කොළයක් 80/- බැගින් කොළ 40ක් මුද්‍රණය කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>06.රාජකාරි නිල හැඳුනුම්පත් හා සමූහ ඡායාරූප සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල (රු) | | | |
|---|---|---|---|---|
| | Studio Edwins, Galle road, Aluthgama | Studio Just Click One, Bus stand shopping complex Aluthgama | Telma Studio Galle road, Aluthgama | LC Printers & Adverstising (pvt)ltd, Galle road, Beruwala |
| ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා රාජකාරි නිල හැඳුනුම්පත් 23 | රු. 400/- | රු. 400/- | - | රු.450/- |
| ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය ඇතුළත් වන සමූහ ඡායාරූප 25 | රු. 1.900/- print & Laminte only | රු. 850/- print & Laminte only<br>රු.3,300/-with frame | රු.3,500/-with frame | රු. 858/- print & Laminte only |

ප්‍රදේශයේ ආසන්න ආයතන 04 ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ Aluthgama, Bus stand shopping complex, Studio Just Click One ආයතනයෙන් එක් හැඳුනුම්පතක් රු. 400/- බැගින් හැඳුනුම්පත් 23ක් සහ රු. 3300/- බැගින් රාමුව සහිත සමූහ ඡයාරූප 25ක් සකස් කර ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**07.තණකොළ කපන මැෂිමක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | ප්‍රමාණය | නිෂ්පාදිත මාදිලිය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | |
|---|---|---|---|---|---|
| | | | BC Paint Beruwala | F.H. Tools Centre Dhargatown | UKG Enterprises (pvt)ltd Galle |
| තණකොළ කපන මැෂිම | 01 | DBL | රු. 21,500/- වගකීම මාස 06 | රු. 21,000/- වගකීම මාස 06 | රු. 21,500/- වගකීම මාස 06 |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ Dhargatown, main street පිහිටි F.H. Tools Centre ආයතනයෙන් මාස 06ක් වගකීමක් සහිතව DBL වර්ගයේ තණකොළ කපන මැෂිමක් රු. 21,000/- ක මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**08.පුස්තකාල සඳහා අවශ්‍ය ග්‍රන්ථ මිලදී ගැනීමට කොළඹ අවට සහ නුගේගොඩ යාම වෙනුවෙන් කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| පුස්තකාලවලට අවශ්‍ය ග්‍රන්ථ මිලදී ගැනීම සඳහා කොළඹ අවට සහ නුගේගොඩ යාමට ආසන 12 වෑන් රථයක් ලබා ගැනීම | මිල ගණන් ඉදිරිපත් කර ඇති අයගේ විස්තර | | |
|---|---|---|---|
| | ඩබ්.ඩී. කමල් රෝහිත නුගේඩුමුල්ල කුඩා ඌරගහ | ඩබ්.විජිතසිරි, කපුගෙවත්ත,මහ ඉඳුරුව | එච්.එල්. හේමප්‍රිය පැලගස්පලාත කොස්ගොඩ |
| වාහන අංකය | HL 6409 NISSAN CARAVAN | 53-0464 TOYOTA HIACE | HI 0191 NISSAN CARAVAN |
| ඉදිරිපත් කර ඇති මිල (රු) | 20,000/- | 20,000/- | 24,000/- |

ප්‍රදේශයේ ආසන්න පදිංචි වෑන් රථ හිමිකරුවන් 03න් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව, කුඩා ඌරගහ, නුගේඩුමුල්ල ලිපිනයේ පදිංචි ඩබ්.ඩී. කමල් රෝහිත මහතාට අයත් අංක HL 6409 දරණ NISSAN CARAVAN වර්ගයේ වෑන් රථය සඳහා ඉදිරිපත් කර තිබූ රු. 20,000/- ක මුදලකට අදාල ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**09.බලපත්‍ර ගාස්තු ලේබනය මුද්‍රණය කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

ආදායම් අංශය භාවිත කරනු ලබන බලපත්‍ර ගාස්තු ලේබන ගබඩාව තුළ තොග අවසන් වීම හේතුවෙන් එම ලේබන කඩිනමින් මුද්‍රණය කර ගැනීම සඳහා දැනට එහි මුද්‍රිත ආකෘතිය (Plate) සතු සභාවේ ලියාපදිංචි අළුත්ගම, දුම්රියපොල පාර පිහිටි Sri Vijaya Printers ආයතනයෙන් ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.ඒ අනුව අදාල ආයතනයෙන් එක් ලේබනයක් මුද්‍රණය සඳහා රු.1,850.00 ක මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර අතර, එම මිල ගණන් යටතේ බලපත්‍ර ගාස්තු ලේබන 06ක් අළුත්ගම Sri Vijaya Printers ආයතනය වෙතින් කඩිනමින් මුද්‍රණය කරවා ගැනිමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**10. පෙර පාසල් වාර්ෂික විවිධ ප්‍රසංගය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය පොත් සහ පාසල් උපකරණ මිලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අනු අංකය | අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|---|---|
| | | | Chamara book shop Ambalangoda රු. | SPC – Ambalangoda රු. | Narah Comuters Forms – Colombo 03 රු. |
| 1 | පිටු 80 රූල් නැති පොත් | 118 | 50.00 (Chamara) | 52.50 (SPC) | 47/50 (TEN) |
| 2 | පිටු 80 අඟල් 1 තනිරූල් පොත් | 118 | 50.00 (Chamara) | 52.50 (SPC) | 47/50 (TEN) |
| 3 | පිටු 80 අඟල් 1 කොටු රූල් පොත් | 118 | 50.00 (Chamara) | 52.50 (SPC) | 47/50 (TEN) |
| 4 | පිටු 80 තනිරූල් CR පොත් | 471 | 107.00 (Chamara) | 108.50 (SPC) | 110/92 (TEN) |
| 5 | පිටු 80 චිත්‍ර පොත් | 108 | 135.00 (Chamara) | 175.00 (SPC) | 141/60 (TEN) |
| 6 | පිටු 120 බොටනි CR පොත් | 49 | 210.00 (Chamara) | 217.00 (SPC) | 165/20 (TEN) |
| 7 | පාට පැන්සල් පෙට්ටි (12 ) | 108 | 390.00 (Nataraj) | 260.00 (Aura) | 158/12 (TEN) |

සභාවේ ලියාපදිංචි ආයතන වෙතින් සහ ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සහ සාම්පල පරීක්ෂා කරන ලද කමිටුව ඒ අතරින් ඉහල ගුණාත්මක භාවයක් සහිත පාසල් පොත් සාම්පල ඉදිරිපත් කර තිබූ, අම්බලන්ගොඩ, මහ වීදිය, සී/ස රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් (SPC) ඉදිරිපත් කර තිබූ මිල ගණන් පිලිගැනීමටත් ඒ අනුව අයිතම අංක 01 සිට 07 දක්වා වූ අයිතමයන් එම ආයතනයෙන් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**11. පෙර පාසල් වාර්ෂික විවිධ ප්‍රසංගය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය සහතිකපත් මුද්‍රණය කිරීම මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් | |
|---|---|---|---|
| | | LC Pronters & Adverstising (pvt) ltd, Galle road, Beruwala<br>රු. | Nimra Media House Chaminda Building Aluthgama<br>රු. |
| A4 ප්‍රමාණයේ ART BOARD වර්ණ සහතික පත්‍ර | 110 | 68/18 | 90/- |

ප්‍රදේශයේ ආසන්න ආයතන 02ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් පරීක්ෂා කරන ලද කමිටුව, ඒ අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Beruwala, Galle road, පිහිටි LC Pronters & Adverstising (pvt)ltd, ආයතනයෙන් එක් සහතික පත්‍රයක් රු. 68/18ක මුදලකට මුද්‍රණය කරවා ගැනිමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**12. ගලි බවුසරය සඳහා අවශ්‍ය ගලි බට මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | |
|---|---|---|---|---|
| | | BC Paint Beruwala<br>රු. | F.H. Tools Centre Dhargatown<br>රු. | UKG Enterprises (pvt)ltd , Galle<br>රු. |
| ගලි බවුසරය සඳහා අවශ්‍ය සුදුසු ගලි බට | අඩි 120 | මීටර් 01ක් රු. 625/-<br>මීටර 37 මිල රු23,125/-<br>PVC Grey | අඩියක මිල රු.200/-<br>අඩි 120 කමිල රු.24,000/- | මීටර 01ක මිල රු. 1595/-<br>මීටර 40 මිල රු. 63,800/-<br>Suction Hose Grey 32kg Heavy |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් අතරින් Beruwala, BC Paint ආයතනය හා Dhargatown, F.H. Tools Centre ආයතනයෙන් ගලි බවුසරයේ දැනට භාවිත කරන වර්ගයේ බට සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.කෙසේ නමුත් ගලි බවුසරයේ මේ වන විට

භාවිත කරනු ලබන ගලි බට ඒ සඳහා සුදුසු තත්ත්වයක නොපවතින අතර,දිර්ඝ කාලිනව භාවිත කිරීමට නොහැකි තත්ත්වයක පවතින බවත් කෙටි කාලයක් තුළ බට කාන්දුවීම් වලට ලක්වන බවත් එහි ක්‍රියාකරු දන්වා ඇත.මේ හේතුවෙන් එම සේවකයන් දැඩි අපහසුතාවයකට ලක්වන බවත් එය ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාවට නුසුදුසු සේම මුදල් ගෙවා සේවාවන් ලබා ගන්නා පාරිභෝගික ජනතාවගේ ද දැඩි අප්‍රසාදයට ලක්වන බැව් දන්වා ඇත.එබැවින් මේ සඳහා ඉතා සුදුසු වර්ගයේ ගලි බට ලබාදිම උචිත බව කමිටුව තීරණය කරන ලදි.ඒ අනුව වඩාත් සුදුසු වර්ගයේ ගලි බට සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ගාල්ල,වෝඩ් පෙදෙස,නො.39 පිහිටි UKG Enterprises (pvt)ltd වෙතින් Suction Hose Grey 32kg Heavy වර්ගයේ බට 40m ක් රු. 63,800/-ක මුදලකට මිලදි ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි

**<u>13.වීජී පහන් උපකරණ මිලදි ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/14 සිට 2025/11/28 දක්වා

| අයිතමය පිළිබඳ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Welux Enterprises<br>Colombo 11 | Chaminda Electricals<br>Matara | Silver Line Electricals<br>Siyabalape | Jummanah Enterprises<br>Colombo 11 | Orel Corporation pvt ltd<br>Ja -Ela | Orient Electircals<br>Colombo 10 | Marlbo Trading Company<br>Colombo 03 | STC-Matara | A.D.Weerasinghe Kadawatha | U.K.Electricals<br>Colombo 11 | Misheli Electricals<br>Dankotuwa | N.M.I.Infra(pvt)ltd<br>Colombo 06 | Asian Electrical<br>Colombo 11 |
| ආම්ශෙඩ් කට්ටල<br><br>සාමාන්‍ය ලාම්පු ආවරණ කට්ටලය ¾ හෙවි ඩියුටි GI පයිප්ප (ඝනකම 2.3mm අවම 45" දිග) ආධාරකය වාත්තු ඇලුමිනියම් - 9"(Shade) ආවරණය පොලිකාබනේට් තහඩු රවුම් (3" උසැති)<br><br>ස්කෘ ත්‍රෙඩ් හෝල්ඩරය (pendent holder)<br><br>"5/8×12" පොට සහිත G.I ඇණ 02ක් සහ බෝල්ට්,වොෂර්,වාත්තු ඇලුමිනියම් කණු අල්ලු 02ක් සමඟ | 100 | 3080/- | 3320/- | 4900/-<br>No 1<br><br>3400/-<br>No 2<br><br>2500/-<br>No 3 | 3150/ | - | 2100/- | 2290/- +VAT<br><br>4900/- +VAT | - | 2700/-<br>අවු 05 | 3023/75 | 2650/-<br>අවු 10 | - | 1950/- |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගම්ටේප් | 50 | 110/-<br>akko star | 125/<br>orange | 99/- | 95/-<br>akko star | 131/25<br>orange | 100/- | 180+18<br>Green | - | 102/-<br>Green | 148/63<br>kelani | 100/-<br>Kevilton<br>100/-<br>Green | 132/<br>Green | 150/<br>kelani |
| ත්‍රෙඩ් හෝල්ඩර (pendent holder) | 500 | 210/-<br>china | 295/-E-27 ceramic tara<br>195/- pendant ceramic<br>120/- Pendant holder | 430/-<br>340/- | 170/-<br>china | - | 100/- | 154+vat<br>Tannay | 359/- Polycorme(Screw type)<br>178/99 Polycrome(pin) | 125/- (Pocylen) අවු 01 (polycorme)<br>300/- plastic අවු 01 (polycorme) | 394/63<br>polichrome | TARA<br>340/-<br>අවු 02<br>PRC china<br>120/-<br>මාස 06<br>4800/-<br>(SR Cable Life Fire guard) Life time | -<br>- | 250/-<br>porcelin<br>5300/-<br>orange |
| පී.වී.සී. 1/"1.3mm වයර් (1mm) SLS 733<br>100m | 75 | - | 4950/-<br>orange | 5830<br>kelani | Suncable 5050/-<br>Wireman/ruhunu 5475/-<br>Sierra cable 5650<br>Acl 5965/-<br>Kelani 5985/- | 5209/49<br>orange | 5500/- | 6900/-<br>+vat<br>Seerra | 5845/72<br>Orange (blue/ Brown) | 5180/- Orange Life time<br>4890/- Life time | 6098/75<br>(Acl/Kelani) | | | |

සභාවේ ලියාපදිංචි ආයතන වෙතින් මිල ගණන් කැඳවා තිබූ අතර, ඉන් ආයතන 13ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම ආයතන 13 අතරින් ආයතන 03ක් පමණක් මිල ගණන් සමඟ සාම්පල ඉදිරිපත් කර තිබූ හෙයින් එම ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමට කමිටුව තීරණය කරන ලදි. ඒ අනුව අදාල සාම්පල පරීක්ෂා කල කමිටුව අංක 01 අයිතමය වූ ආර්ම් ශේඩ් කට්ටල සඳහා වඩා සුදුසු හා නියමිත පිරිවිතරයන්ට අනුව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ කොළඹ 11, 1වන හරස් විදිය,3වන මහල,වතුර ප්ලාසා නො.93/3/7 පිහිටි Welux Enterprises ආයතනය වෙතින් එක් ආර්ම් ශේඩ් කට්ටලයක් රු. 3080/- ක මුදලකට කට්ටල 100ක් මිලදී ගැනීමටත්,

අංක 02 අයිතමය සඳහා වෙළඳපොලේ පිළිගත් නිෂ්පාදිතයක් වූ orange මාදිලියෙන් යුත් ගම් ටේප් 01ක් රු.125/- බැගින් ටේප් 50ක්, අංක 03 අයිතමය ත්‍රේඩ් හෝල්ඩර් (pendent holder) රු.120 බැගින් හෝල්ඩර් 500ක්, අයිතම අංක 04 pvc1/1.3mm වයර් (1mm) sls 733(100m) සඳහා orange නිෂ්පාදිත මාදිලියෙන් යුත් වයර් කොයිල් සඳහා අවම මිල වූ වයර් රෝලක් රු.4950/- බැගින් රෝල් 75ක්, මාතර,මාකාවිට,අබේදොලතැන්න චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් වෙතින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>14.බලිවල කසල අංගනයේ ගොඩගැසී ඇති කසළ තුනි කිරීමට PC 45 ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගැනීම හා කසළ අංගනය මැදින් කෙලවරට ට්‍රැක්ටර් රථ වලට ගමන් කිරීමට හැකි වන පරිදි කොරිපස් යෙදීම සඳහා කොරිපස් මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/17 සිට 2025/11/28 දක්වා

ලියාපදිංචි සහ ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් කැඳවන ලදුව, ඉන් ආයතන 01ක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. ඒ අනුව, ඌරගස්මංහන්දිය,රන්තොටුවිල,අද්දන්තුඩුව පිහිටි I.S.C. CONSTRUCTION & SUPPLIES ආයතනයෙන් PC 45 ස්කැවේටර් යන්ත්‍රය සඳහා යන්ත්‍ර පැයකට රු.3,400/- මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර එම මිල ගණන් පළාත් මිල ගණන් අනුව සැසඳෙන බැවින් එම යන්ත්‍රය කුලී පදනම මත ලබා ගැනිමටත්, කොරිපස් කියුබ් 01ක් සඳහා එම ආයතනයෙන් ඉදිරිපත් කර තිබූ රු12,000/-ක මුදලකට කියුබ් 04ක් මිලදී ගැනීමටත් ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි. (පවතින අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් කසල අංගනය තුළ ට්‍රැක්ටර් රථවලට ගමන් කිරීමට අපහසු බැවින් එම රථ ගමන් කිරීමට හැකි පරිදි කොරිපස් යොදා මාර්ගය සකස් කිරීමට)

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. කේ.ඩී.මිගාර නේමින්ද මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.12.02 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී තාරක විජේකෝන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

6.3. 2025.12.08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**2025.12.08 දින පෙ.ව.10.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
4. ඩී.ඩී. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් නිර්දේශ කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 65 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා ඉන්ධන දීමනාව ගෙවීම. 2025 නොවැම්බර් | 87,000.00 |
| 02 | 66 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා දුරකථන දීමනාව ගෙවීම. 2025 නොවැම්බර් | 4,500.00 |
| 03 | 67 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා දුරකථන දීමනාව ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 4,500.00 |
| 04 | 68 | මුදල් භාරකරු<br>ඩී.ඩී.ආර්.එස් වික්‍රමරත්න | සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා ආදායම් බලපත්‍ර හා යෝග්‍යතා සහතික ලබාගැනීම වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලබාගැනීම | 30,880.00 |
| 05 | 69 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය සඳහා මන්ත්‍රී දීමනාව ගෙවීම. 2025 නොවැම්බර් | 198,700.00 |
| 06 | 70 | මොබිටෙල් පුද්ගලික සමාගම | 071-7913428 දරණ දුරකථනයේ wifi බිල හා 071-4920312 දරණ දුරකතනයේ SMS බිල පියවීම | 5,141.11 |
| 07 | 71 | Nimra Media House | 2026 අයවැය ලේඛනය සැකසීම වෙනුවෙන් මුද්‍රණ කටයුතු සඳහා දරණ ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 16,000.00 |
| 08 | 72 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම<br>2025.11.14 – 2025.11.21 | 81,220.75 |
| 09 | 73 | Sun Shine Stationers | කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 79,980.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | 74 | P.N. Constructions | හොරවල තොටුපොළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම්ගත කොන්ත්‍රාත් ආයතනය විසින් තබා ඇති ලංසු සුරක්ෂණය නිදහස් කිරීම | 70,000.00 |
| 11 | 75 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් සිලින්ඩර 05ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 82,960.00 |
| 12 | 76 | ලංකා බැංකුවේ ජී.ඩී.එල්.කේ.ගල්පය ගි.අ.78206776 | අංගාගොඩ පෙර පාසලේ ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම.2025 ඔක්තෝම්බර් | 11,535.00 |
| 13 | 77 | ලංකා බැංකුවේ එන්.ඩී.සිරිවර්ධන ගි.අ.76927973 | දෝපේ පෙර පාසලේ ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම.2025 ඔක්තෝම්බර් | 9,981.80 |
| 14 | 78 | මහජන බැංකුවේ පී.කේ.කේ.ශෂිකා ගි.අ.084200110040899 | මහ ඉඳුරුව පෙර පාසලේ ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම.2025 ඔක්තෝම්බර් | 21,560.00 |
| 15 | 79 | ඩබ්ලිව්.ලසන්ති මල්මි බොතේජු ගි.අ.101108817464 | කුඩා ඌරගහ පෙර පාසලේ ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම.2025 ඔක්තෝම්බර් | 20,432.00 |
| 16 | 80 | එච්.ඒ.සුනිල් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 19,088.33 |
| 17 | 81 | එම්.එස්.ඩී.චන්දිම ප්‍රියංකර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 13,906.24 |
| 18 | 82 | සී.අයි.ඩබ්.සිරිමාන්න | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 2,452.32 |
| 19 | 83 | තාරිකා සඳරු කන්නන්ගර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 5,083.83 |
| 20 | 84 | මුදිත ධර්ම ගුණසේකර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 18,193.50 |
| 21 | 85 | ගාමිණී සමරවීරහෙට්ටි | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 19,250.00 |
| 22 | 86 | යූ.එච්.හෙට්ටිආරච්චි | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 950.33 |
| 23 | 87 | ගාමිණී අබේවික්‍රම | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 14,314.99 |
| 24 | 88 | කේ.අජිත් ජයරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 28,899.99 |
| 25 | 89 | ඩබ්.සී.එන්.මෙන්ඩිස් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 2,019.68 |
| 26 | 90 | කේ.ඒ.ප්‍රභා මධුෂානි | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 7,221.35 |
| 27 | 91 | චාමින්ද අබේවික්‍රම | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 9,833.33 |
| 28 | 92 | ඩී.එම්.පී.කේ.නානායක්කාර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 14,383.33 |
| 29 | 93 | එච්.එල්.වජිර රංජන් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 12,318.85 |
| 30 | 94 | ඩී.කේ.ඩී.කේ.රුවන් ප්‍රසන්න | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 6,999.99 |
| 31 | 95 | මහකුමාරගේ දර්ශන ප්‍රදීප් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,333.33 |
| 32 | 96 | කේ.දමිත් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 9,499.99 |
| 33 | 97 | ඉන්දික හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 8,112.64 |
| 34 | 98 | ඩී.ජී.අයි.ප්‍රියංකර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 7,352.81 |
| 35 | 99 | කේ.දුමින්ද විජේරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 13,608.33 |
| 36 | 100 | කේ.ඒ.කෝසල | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 15,323.33 |
| 37 | 101 | එම්.කේ.අමිල රුවන් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 12,019.23 |
| 38 | 102 | එම්.ඩබ්.අජිත් කුමාර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 9,270.83 |
| 39 | 103 | එම්.එස්.ගුණසේකර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 18,541.66 |

| | | | | |
|---|---|---|---|---|
| 40 | 104 | එච්.එම්.දිලුනි භාග්‍යා | අතිකාල දීමනා ගෙවීම. 2025 ඔක්තෝම්බර් | 1,499.99 |
| 41 | 105 | එච්.එම්.දිලුනි භාග්‍යා | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,499.99 |
| 42 | 106 | කේ.ඒ.සනත් සුසන්ත | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 16,433.33 |
| 43 | 107 | කේ.ඩී.කේ.රවී | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 7,694.95 |
| 44 | 108 | පී.ඩී.රුවන් කුමාර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 13,210.93 |
| 45 | 109 | කසුන් උදාර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 19,999.99 |
| 46 | 110 | බී.ජනක | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 13,992.62 |
| 47 | 111 | එල්.එච්.ලලිත් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 3,855.04 |
| 48 | 112 | එස්.කේ.ජානක | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 8,791.66 |
| 49 | 113 | කේ.දිමුතු ලසන්ත | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 7,247.99 |
| 50 | 114 | යූ.කේ.නදීශා ආරියරත්න | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 11,495.83 |
| 51 | 115 | ආර්.සී.ජයනාත් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 4,215.70 |
| 52 | 116 | එම්.නිලංක | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 16,666.66 |
| 53 | 117 | කාල් දම්මිත් වාද්දුවගේ | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 3,286.00 |
| 54 | 118 | එච්.එම්.දිලුනි භාග්‍යා | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 දෙසැම්බර් | 516.00 |
| 55 | 119 | බී.ජනක | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,900.00 |
| 56 | 120 | ඒ.කේ.ටෙක්ලා නිරුෂාණි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,680.00 |
| 57 | 121 | ආර්.සී.ජයනාත් | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,180.00 |
| 58 | 122 | ගාමිණී සමරවීරහෙට්ටි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 2,660.00 |
| 59 | 123 | යූ.එච්.හෙට්ටිආරච්චි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,548.00 |
| 60 | 124 | බී.නුවන් ධනුෂ්ක උපාලි | ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 1,008.00 |
| 61 | 125 | බී.නුවන් ධනුෂ්ක උපාලි | පරාවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 5,200.00 |
| 62 | 126 | කේ.ඩී.කේ.රවී | පරාවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 5,200.00 |
| 63 | 127 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ සුළු මුදල් අත්තිකාරම ප්‍රතිපූර්ණය කිරීම | 8,593.00 |
| 64 | 128 | මුදල් භාරකරු<br>ඒ.සී.චන්ද්‍රානි | කාන්තා සවිබලකරණය උදෙසා වන මැහුම් පාඨමාලාවේ මූලික අවශ්‍යතා සඳහා අත්තිකාරම් මුදල් ලබාදීම | 11,400.00 |
| 65 | 129 | මුදල් භාරකරු<br>කේ.එල්.එස්.නිලක්ෂි | 2026 අයවැය ලේඛනය සැකසීම සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් අත්පිට දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීම | 4,640.50 |
| 66 | 130 | මුදල් භාරකරු<br>ඩී.ඩී.සතාරා නදීශානි | නිවාඩු දින වැටුප් ගෙවීම. 2025.10.11, 2025.10.18, 2025.10.20 | 1,466.00 |

| | | | | |
|---|---|---|---|---|
| 67 | 131 | මහජන බැංකුවේ ඩී.වී.කසුනි ගයාත්‍රි ගි.අ.084200110042370 | 2025 නොවැම්බර් මස දීමනාව ගෙවීම. | 22,070.00 |
| 68 | 132 | ලංකා බැංකුවේ එම්.ඩී.පැතුම් තරංග අබේරත්න ගි.අ.78441739 | 2025 නොවැම්බර් මස දීමනාව ගෙවීම | 24,163.94 |
| 69 | 133 | ලංකා බැංකුවේ ඩබ්.කේ.අවිනි තරුෂිකා ගි.අ. 87113036 | 2025 නොවැම්බර් මස දීමනාව ගෙවීම | 24,555.55 |
| 70 | 134 | සී/ස රෙඩ් ඊගල්ස් ආරක්ෂක සේවා (පුද්) සමාගම | 2025 නොවැම්බර් මස ආරක්ෂක සේවා ගාස්තු ගෙවීම. | 157,441.50 |
| 71 | K01 | බෙන්තොට සමුපකාර ග්‍රාමීය බැංකුවේ ගල්බඩ කටුකොළිහ වීර පැරකුම් ග්‍රාම සංවර්ධන සමිතිය ගි.අ.1025395-7 | ගල්බඩ ගම්මැද්ද මාර්ගය කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත පියවීම | 560,199.85 |
| 72 | K02 | රන්තොටුවිල ප්‍රජා මූල බැංකුවේ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය ගි.අ.2257154 | රන්තොටුවිල ආචාරියවත්ත වටරවුම් මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ බිල්පත පියවීම. | 810,000.00 |
| 73 | K03 | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශාන්ති වැඩිහිටි සංවිධානය ගි.අ.215011500002 | කයිකාවල බණ්ඩාරිගොඩ හබක්කල මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ බිල්පත පියවීම. | 1,119,533.38 |

2025.12.08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.4. 2025.12.12 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>2025/12/12 දින පෙ.ව.,09.00ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී රැස්වූ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගීත්වය

1.ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2.ලෙනිකා දුශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3.පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
4.උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී

**<u>01.ප්‍රාදේශීය සභා කසළ අංගනයේ දුර්ගන්ධය පැතිරීම වැළැක්වීම හා මැස්සන් පලවා හැරීම සඳහා අවශ්‍ය ද්‍රාවණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/26 සිට 2025/12/10 දක්වා

| අවශ්‍ය අයිතමය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | Orayan Enterprises 80/9 Nawala road,Narahenpita<br><br>ඒකකයක (රු) | Pure Spheres pvtltd 20/13,School Lane,Nawala road,Rajagiriya<br>ඒකකයක මිල (රු) | K.D.Enterprises No 153/6,S.D.S.Jayasinghe mw,Nugegoda<br>ඒකකයක මිල (රු) |
| දුර්ගන්ධ පාලන ද්‍රාවණ 04L | 16,000/- | 13,200/- | 18,000/- |
| මැස්සන් පාලන ද්‍රාවණ 04L | 18,000/- | 13,500/- | 24,000/- |

අදාල ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ Rajagiriya, Nawala road, School Lane, 20/13, ලිපිනයේ පිහිටි Pure Spheres (pvt) ltd ආයතනයෙන් දුර්ගන්ධ පාලන ද්‍රාවණ 04L ක් රු. 13,200/- ක මුදලකටත්, මැස්සන් පාලන ද්‍රාවණ 04Lක් රු. 13,500/- ක මුදලකටත් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>02.ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට සභාවේ නම භාෂා ත්‍රිත්වයෙන් සහ සභා ලාංඡනය ප්‍රදර්ශනය කිරිම සඳහා නාම පුවරුව සැකසීමට මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/20 සිට 2025/12/10 දක්වා

| අවශ්‍ය අයිතමය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | LC Printers & Advertising (pvt)Ltd, Galle Road, Beruwala<br><br>ඒකකයක (රු) | Ameer Arts No65/2,HoranaRoad, Eluwila,Panadura<br><br>ඒකකයක මිල (රු) | Easy Print Advertising No12,MainStreet, Kalutara<br><br>ඒකකයක මිල (රු) |
| 4.5’×2.5’ප්‍රමාණයේ කැලැඩින් බෝඩයේ පැති දෙකෙහි වර්ණ සහිත (box bar රාමුව සහිතව මුදු දෙකක් යොදා ) | 17,000/- | 20,000/- | 23,000/- |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ Beruwala, Galle Road, පිහිටි LC Printers & Advertising (pvt) Ltd,ආයතනයෙන් රු. 17,000/- ක මුදලකට නාම පුවරුව නියමිත පිරිවිතරයන්ට අනුකූලව සකසා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>03.2016 වර්ෂය සඳහා පාපැදි/කරත්ත බලපත්‍ර තහඩු සකස් කර ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**
මිල ගණන් කැඳවූ කාලය - 2025/11/20 සිට 2025/12/10 දක්වා

| අවශ්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|---|
| | | "ගිහාන්ස්" පී.පී.ඩබ්.ඩී.එස්. මල්ලිකා හැලකන්දල හොරම්පැල්ල ඒකකයක (රු) | "නදීෂා" අංක 44,විශ්ව විද්‍යාල පාර,කටුබැද්ද,මොරටුව ඒකකයක මිල (රු) | මලිත් ඉන්ඩස්ට්‍රීස්, සසිරිපාය, මීගමුව ඒකකයක මිල (රු) |
| පාපැදි තහඩු | 100 | 95/- | 200/- | 200/- |
| පාපැදි නොවන තහඩු | 40 | 195/- | 250/- | 200/- |
| කරත්ත තහඩු | 15 | 195/- | 300/- | 250/- |

අදාල ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ හොරම්පැල්ල, හැලකන්දල පිහිටි පී.පී.ඩබ්.ඩී.එස්.මල්ලිකා "ගිහාන්ස්" ආයතනයෙන් එක් පාපැදි තහඩුවක් රු.95/- ක මුදලකට තහඩු 100ක්, පාපැදි නොවන හා කරත්ත තහඩුවක් රු.195 බැගින් තහඩු 55 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>04.බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය/රාත්‍රී පිරිත් සජ්ඣායනය හා පසුදින දහවල් දානමය පිංකම සඳහා අවශ්‍ය ශබ්ද විකාශන පහසුකම් ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**
මිල ගණන් කැඳවූ කාල සීමාව - 2025/12/01 - 2025/12/12

| අවශ්‍ය අයිතමය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | Shamen Electronic Yalegama, Induruwa | N.S. Sounds, Elakaka, Haburugala | Nishantha Sounds, Haburugala, Bentota |
| FM මයික් අධාරක සමඟ/ බෆල් (AMP/mixer with) පෝඩියම් සමඟ Full Set | රු. 32,000/- ප්‍රවාහනය සමඟ | රු. 34,000/- ප්‍රවාහනය සමඟ | රු. 34,000/- ප්‍රවාහනය සමඟ |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන 03ක් වෙතින් මිල ගණන් ලිපි ඉදිරිපත් කර තිබුනි. මිල ගණන් සලකා බැලූ කමිටුව අදාල අයිතමයන් සියල්ල ලබාදීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ඉදුරුව,යාලේගම, Shamen Electronics වෙතින් රු.32,000/= ක මුදලකට එම සේවාව ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>05.නවීකරණය කරන ලද ප්‍රධාන කාර්යාලය විවෘත කිරීමේ සමරු ඵලකය සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| අවශ්‍යා අයිතමය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් (රු) | | |
|---|---|---|---|
| | LC Printers & Advertising (pvt)Ltd, Galle Road, Beruwala<br><br>ඒකකයක (රු) | Ameer Arts No65/2,HoranaRoad, Eluwila,Panadura<br><br>ඒකකයක මිල (රු) | Easy Print Advertising No12,MainStreet, Kalutara<br><br>ඒකකයක මිල (රු) |
| 4'×2' ප්‍රමාණයේ Black Tile Print සමරු ඵලකය | 28,000/- | 30,000/- | 32,000/- |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ Beruwala, Galle Road, පිහිටි LC Printers & Advertising (pvt)Ltd,ආයතනයෙන් රු. 28,000/- ක මුදලකට සමරු ඵලකය සකසා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>06.ප්‍රා.ස. 01 රිසිට්පත් මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

ඉහත සඳහන් මුද්‍රණ කටයුතු වෙනුවෙන් සභාවේ ලියාපදිංචි ආයතන වෙතින් හා ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් කැඳවුව ද ඉන් එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.මේ සම්බන්ධයෙන් අදාල ආයතන වෙතින් විමසීම් කළ අතර එහිදි එම ආයතන දැනුම් දි ඇත්තේ ඉහත සඳහන් වර්ගයේ රිසිට්පත් මුද්‍රණය කිරීමේ හැකියාවක් එම ආයතන සතුව නොමැති බවයි.කෙසේ නමුත් අදාල ආයතන මිල ගණන් ඉදිරිපත් නොකල ද රිසිට්පත් ඉතා කඩිනමින් අදායම් අංශය වෙත මුද්‍රණය කර දිය යුතු බැවින් මිල ගණන් ඉදිරිපත් කර තිබූ සභාවේ ලියාපදිංචි ආයතනයක් වන අළුත්ගම, දුම්රියපොල පාර පිහිටි ශ්‍රී විජය මුද්‍රණ ශිල්පියෝ වෙතින් එක් රිසිට්පතක් රු.14/70ක මුදලකට රිසිට්පත් 5000ක් මුද්‍රණය කරවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>07.වීථි පහන් නඩත්තු උපකරණ මිලදි ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| | අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා මිල ගණන් | |
|---|---|---|---|---|
| | | | Sri lanka state trading corporation l.t.d (STC – Matara)<br><br>Rs (with in vat) | Marlbo Trading Company<br>24, Abdul Gaffor Mw, Colombo 03<br>Rs (with in vat) |
| 1 | ආරක්ෂිත බඳ පටි | 02 | Adela Belt H227<br>19,979.76 | 12D5 Fuji Japan<br>103,840/-<br>1 year warranty |
| 2 | පොදු අඩු (110v – 500v) | 03 | - | T-stop<br>9735/-<br>(3 month warranty) |
| 3 | 2.5mm/දෙපට වයර් | 200m | - | 519/- (1-m)<br>Local |
| 4 | 32 MCB | 12 | Orange<br>924/71 | 1,711/-<br>China<br>(1 year warranty) |
| 5 | 2 Pole MCB box | 12 | Polycrome<br>250/- | 295/-<br>Local<br>(1 year warranty) |
| 6 | Digital Ampere Meter | 01 | - | 51,282/80<br>Kyoritsu 2007R<br>(1 year warranty) |
| 7 | ඇලුමිනියම් බයින්ඩින් කම්බි | 50kg | - | 8,142/- (1KG)<br>Local |

සභාවේ ලියාපදිංචි ආයතන වෙතින් මිල ගණන් කැඳවා තිබූ අතර ඉන් ආයතන 02ක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.අදාල මිල ගණන් සලකා බැලූ කමිටුව අයිතම අංක 01 සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ මාතර,දුම්රියපොල පාර, පිහිටි Sri lanka state trading corporation l.t.d (STC – Matara) ආයතනයෙන් Adela Belt H227 වර්ගයේ එක් ආරක්ෂිත බඳ පටියක් රු. 19,979.76 ක මුදලකට බඳ පටි 2ක් මිලදී ගැනීමටත්, එම ආයතනය වෙතින් පිළිවෙලින් අංක 04 අයිතමය සඳහා රු. 924/71 බැගින්32 MCB 12ක්, අයිතම අංක 05 සඳහා එකක් රු. 250 බැගින්2 Pole MCB box 12ක් මිලදී ගැනීමටත්,

අංක 02 අයිතමය සඳහා Colombo 03 Abdul Gaffor Mw, 24, පිහිටි Marlbo Trading Company ආයතනයෙන් T-stop වර්ගයේ පොදු අඩුවක් රු. 9735/- බැගින් අඩු 02ක්, එම ආයතනය වෙතින්

පිළිවෙලින්, අංක 03 අයිතමය, මීටර් 01ක් රු. 519/- මුදලකට මීටර 200ක් මිලදී ගැනීමටත්, අංක 07 අයිතමය 1KG රු. 8142 බැගින් 10Kg මිලදී ගැනීමටත්, ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**08.නවීකරණය කරන ලද ප්‍රධාන කාර්යාලයේ ප්‍රදර්ශණය කිරීම සඳහා බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපතිවරුන්ගේ රාමු කරන ලද ඡායාරූප සැකසීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | |
|---|---|---|---|
| | Telma Studio Galle road,,Aluthgama | LC Pronters & Adverstising (pvt)ltd,Galle road,Beruwala | Studio Just Click One,Bus stand shopping complex Aluthgama |
| 12”×15”ප්‍රමාණයට වීදුරුව සහිත රාමු කරන ලද වර්ණ ඡායාරූප | රු. 3460/- | රු. 3500/- | රු. 3450/- |

ප්‍රදේශයේ ආසන්න ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් සලකා බැලූ කමිටුව ඒ අතරින් අවම මිල ඉදිරිපත් කර තිබූ, Aluthgama,Bus stand shopping complex පිහිටි, Studio Just Click One,ආයතනයෙන් එක් ඡයාරූපයක් රු. 3450/- ක මුදලකට ඡයාරූප 7ක් සකසා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**09.සභාවට අයත් RD 4484 ට්‍රැක්ටර් රථය සඳහා නව බැටරියක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| අවශ්‍ය අයිතමය පිළිබඳ විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | | |
|---|---|---|---|---|
| | Kamal Tyre Mart Meegama, Dhargatown | Sri lanka state trading corporation l.t.d (STC – Matara) | Siyanray Electricals Yatadola road, Dharagatown | Sasindu Moters Athuruwella, Induruwa |
| ඇම්පියර් 90 ධාරිතාවයෙන් යුත් බැටරි 01 | Lucas – 32,000/- 01 year warranty | Exide 36,816/- 02 year warranty | Exide 32,000/- 01year warranty | Lucas – 38,000/- 02 year warranty |
| | Lucas – 35,000/- 02 year warranty | පරණ බැටරිය සඳහා අඩු කිරීම - රු.4700/- | Amaron 45000/- (02year warranty Full b2b2) | පරණ බැටරිය සඳහා අඩු කිරීම - Local – රු.6500/- |

| | | | | |
|---|---|---|---|---|
| | Exide 34,000/-<br>01 year warranty | | (2year normal warranty) | Imported රු. 6500/- |
| | Exide 37,500/-<br>02 year warranty | | පරණ බැටරිය සඳහා අඩු කිරීම -<br>Exide රු6000/-<br>Amaron-<br>රු.5000/- | |
| | Amaron 49,000/-<br>02 year warranty | | | |
| | පරණ බැටරිය සඳහා අඩු කිරීම - රු.4500/- | | | |

සභාවේ ලියාපදිංචි සහ ආසන්න ආයතන 04ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. අදාල ආයතන විසින් නිෂ්පාදිත මාදිලි 03ක් සඳහා ලබා දෙන වගකීම් කාල සීමාව අනුව මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.ඒ අනුව අවම මිල ගණන් සමඟ ලබාදි ඇති වගකීම් කාලය පිළිබඳ සලකා බැලු කමිටුව වෙළඳපොලේ පිළිගත් නිෂ්පාදිත නාමයක් LUCAS වර්ගයේ බැටරිය සඳහා වසර 02ක වගකීම් කාලයක් සහිතව අවම මිල ගණන් ලබාදි තිබු දර්ගානගරය,මීගම කමල් ටයර් මාර්ට් වෙතින් රු. 35,000/- ක මුදලකට බැටරිය මිලදි ගැනීමටත් පැරණි  බැටරිය සඳහා රු. 4500/-ලබාදීමෙන් පසු සම්පූර්ණ වටිනාකම රු. 30,500/- ලෙස එම බැටරිය මිලදි ගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**10.ඩෙක්ස්ටොප් පරිගණක/ලැප්ටොප් පරිගණක/ප්‍රින්ටර් හා මල්ටි මීඩියා ප්‍රොජේක්ටර් මිලදි ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.**

මිල ගණන් කැඳවු කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| අනු අංකය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන | අයිතම විස්තරය හා ඉදිරිපත් කර ඇති ආයතනික ඒකක මිල ගණන් (රු) | | | |
|---|---|---|---|---|---|
| | | ඩෙක්ස්ටොප් පරිගණක | ලැප්ටොප් පරිගණක | ප්‍රින්ටර | මල්ටි මීඩියා පොජේක්ටර් |
| 01 | Integrated Micro Systems (pvt) Ltd<br><br>No 9/1,<br>Sri jinarathana mawatha,<br>Aththidiya road,<br>Rathmalana | DELL Inspiron 3030<br>**Rs.268,500/-**<br>3year warranty<br><br>HP Pro tower 280 G9<br>**Rs.272,750/-**<br>4year warranty | HP Laptop 15-fd066otu<br>**Rs.165,000/-**<br>Warranty<br>(option 01& 02) | HP LaserJet Pro 4003dw<br>**Rs.88,600/-**<br>Warranty<br>(option 01& 02) | Acer X1228AH<br>**Rs.153,500/-**<br>Warranty<br>(option 01& 02) |
| 02 | John Keels Office Automation (pvt)ltd<br><br>No 90,<br>Union Place,<br>Colombo 2 | - | - | - | Viewsonic PA 700W<br>Rs.123,500+vat(18%)<br>**Rs 145,730/-**<br>03 Warranty(all Equipment)<br>Lamp - 01 year or 1000h(wich come first) |
| 03 | Ceylon Business<br>Appliances pvt(ltd)<br><br>No 193,<br>Hill street,<br>Dehiwala | Lenovo NEO 50T i5<br>Rs.216,500+vat(18%)<br>**Rs. 255,470/-**<br>3year warranty | - | - | Projector OPTOMA X400<br>Rs.106,312.50+vat(18%)<br>**Rs.125,448.75**<br>02 Warranty(all Equipment)<br>Lamp - 01 year |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | Infotec Office Automation<br><br>No 68,<br>Awariyawatta,<br>Panadura | - | - | HP LaserJet Pro 4003dw<br>**Rs.85,000/-**<br>01 year Warranty | Vivitek Dx813<br>**Rs.119,000/-**<br>03 Warranty(all Equipment)<br>Lamp - 01 year |

සභාවේ ලියාපදිංචි ආයතන 04ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම මිල ගණන් බලපිටිය තාක්ෂණ විද්‍යාලය වෙත යොමු කර නියමිත පිරිවිතරයන්ට අනුකූලව මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන තෝරා ගැනීම සුදුසු බවට කමිටුව තීරණය කරන ලදි.ඒ අනුව බලපිටිය තාක්ෂණ විද්‍යාලයෙන් ඉදිරිපත් කරනු ලබන වාර්තාව අනුව නම් කරනු ලබන ආයතන වෙතින් සභාවට අවශ්‍ය ඩෙක්ස්ටොප් පරිගණක 03ක්, ලැප්ටොප් පරිගණක02ක්, ප්‍රින්ටර් 02ක් හා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 01ක් මිලදී ගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>11.කාර්යාලයට අවශ්‍ය දොර 02 වානේ කබඩ්/ලියන මේස හා ලිපිකරු පුටු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/12/01 සිට 2025/12/12 දක්වා

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකකයක මිල(රු) | | |
|---|---|---|---|---|---|
| | | | Keson Furniutre<br>Main street, ambalangoda | Dhamro<br>Galle road, Aluthgama | Sri lanka state trading corporation l.t.d (STC – station road,<br>Matara |
| 1 | 36” ×18”×72”දොර 02 වානේ කබඩ් | 03 | රු.35,000.15<br>PAUC 631 (piyestra)<br>(2 year warranty) | රු.38,166.25<br>OO3MTU(Dhamro)<br>(2 year warranty)<br><br>රු.47,381.25<br>004MTTU(Dhamro)<br>(2 year warranty) | රු.37,034.30 PAUC 631 (piyestra)<br>(1 year warranty |
| 2 | ඇඳි සහිත කැරකෙන පුටු | 12 | රු. 20,163.50<br>ECL 01<br>(2 year warranty) | රු.20,306.50<br>OCL16BL(Dhamro)<br>(2 year warranty)<br><br>රු.25,151.25<br>KWT038M02<br>(2 year warranty) | රු. 18,095.64<br>ECL 02<br>(1 year warranty) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | 4 ½×2 ½ ප්‍රමාණයේ ලාච්චු 02 සහිත ලියන මේස | 01 | රු.22,785.00<br>PKWT -33<br>(2 year warranty) | රු.23,631.25 | - |
| | | | | රු.31,326.25<br>KWT 021 MO2<br>(2 year warranty) | |

සභාවේ ලියාපදිංචි සහ ප්‍රදේශයේ ආසන්න ආයතන වෙතින් මිල ගණන් කැඳවා තිබු අතර ඉන් ආයතන 03ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි.එම ආයතන විසින් ඉදිරිපත් කර තිබු මිල ගණන් සමඟ අදාල නිෂ්පාදිත මාදිලි කේතයන් අනුව ඒවායේ පිරිවිතරයන් පිළිබඳ කමිටුව පරික්ෂා කරන ලදි. ඒ අනුව අම්බලන්ගොඩ,මහ වීදිය පිහිටි Keson Furniutre ආයතනය වෙතින් 36" ×18"×72" ප්‍රමාණයේ දොර 02 PAUC 631 (piyestra) කේතයෙන් යුත් දොර 02 වානේ කබඩ් 1ක් රු.35,000/15 බැගින් කබඩ් 3ක්, ECL 01 කේතය සහිත piyestra වර්ගයේ ඇඳි සහිත කැරකෙන පුටුවක් රු. 20,163.50 බැගින් පුටු 12ක් හා PKWT -33 කේතයෙන් යුත් 4 ½×2 ½ ප්‍රමාණයේ ලාච්චු 02 සහිත ලියන මේසයක් රු 22,785/00 මුදලකට මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>12.ප්‍රාදේශීය සභා පෙර පාසල් විවිධ ප්‍රසංගය හා ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත් වීම සඳහා අඩි 20× 16 ප්‍රමාණයේ වේදිකාවක් සපයා ගැනීම සඳහා මිල ගනන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/21 සිට 2025/12/12 දක්වා

ප්‍රදේශයේ ආසන්න ස්ථාන වෙතින් මිල ගණන් ලබා ගැනීමට කටයුතු කල නමුත් ඉහත සඳහන් ප්‍රමාණයේ වේදිකා අදාල සැපයුම්කරුවන් ළඟ නොමැති වීම හේතුවෙන් (බොහෝ වේදිකා සැපයුම්කුරුවන් ළඟ 10×10 ප්‍රමාණයේ සහ 20×10 ප්‍රමාණයේ වේදිකා තිබීම) මිල ගණන් ලබා ගැනිමට අපහසු වි තිබුනි.කෙසේ නමුත් ගල්තුඩුව,මිරිස්වත්ත ලිපිනයේ පදිංචි ඩබ්.ප්‍රේමරත්න යන අය සතුව 20×16 ප්‍රමාණයේ වේදිකාවක් රු.15,000/- ක මුදලකට සැපයීමට හැකි බව දන්වා තිබුනි. ඒ අනුව අදාල මිල ගණන් වර්තමාන වෙළඳපොල මිල ගණන් අනුව සාධාරණ බව නිරීක්ෂණය වූ හෙයින් අදාල නම් සඳහන් අයගෙන් එක් දිනක් සඳහා රු. 15,000/- ක මුදලකට වේදිකාවක් සපයා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>13.කසළ එක් රැස් කිරීම් ට්‍රැක්ටර් වලට අවශ්‍ය ටයර්/ටියුබ් හා රෝද රිම් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාලය - 2025/11/21 සිට 2025/12/12 දක්වා

සභාවේ ලියාපදිංචි ආයතන 05ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. එම මිල ගණන් සලකා බැලූ කමිටුව දැනට වෙළඳපොළේ පිළිගත් නිෂ්පාදිත නාමයක් වන ceat ටයර් මිල ගණන් පමණක් සලකා බැලීමට කමිටුව තීරණය කරන ලදි.

ඒ අනුව 600 x 16 ප්‍රමාණයේ 8PR ටයරය සඳහා වැට් රහිත අවම මිල වූ රු.17,423.75 මුදලකට ටයර 04ක්, එම ප්‍රමාණයේ ටියුබ 01ක් සඳහා වැට් රහිත අවම මිල වූ 1938.98ට ටියුබ 04ක්, සහ 12.4/11/28 ප්‍රමාණයේ 12PR ටයරයක් සඳහා වැට් රහිත අවම මිල රු.61,661.03 මිලකට ටයර් 04ක් හා එම ප්‍රමාණයේ ටියුබයක

වැට් රහිත අවම මිල රු.7166.10ට ටියුබ 04ක් ලෙස සමස්ත වැට් රහිත අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ නුගේගොඩ, කොහුවල පිහිටි S.K.M. Tyres (PVT) LTD ආයතනය වෙතින් ටයර් මිලදී ගැනීමටත්,

600X16 ප්‍රමාණයේ රිම් 01ක් සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ඉඳුරුව,අතුරුවැල්ල සසිඳු මෝටර්ස් වෙතින් රිම් 01ක් රු.18,500/= බැගින් රිම් 02ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදි.

**<u>14. බෙන්තොට ප්‍රාදේශිය සභාවට අයත් බෙන්තොට පොදු වෙළඳ කඩ සංකීර්ණයේ අංක 05 කඩ කාමරය දිර්ඝ කාලීනව බඳු දිම සම්බන්ධවයි.</u>**

2025/11/11 දිනැති ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 01 අනුව බෙන්තොට ප්‍රාදේශිය සභාවට අයත් බෙන්තොට වෙළඳ සංකීර්ණයේ 05 වන කඩකාමර සඳහා ඉහළම ලංසු අගය ඉදිරිපත් කර තිබූ බෙන්තොට දෝපේ බෝධිනායගොඩ,ලිපිනයේ පදිංචි අයි.කේ සුරේකා නානායක්කාර යන අය විසින් එම කඩ කාමරය බදු ගැනිමෙන් වලකින බව 2025.12.03 දින ලිඛිතව දැනුම් දී තිබුණි.එසේම අදාල කඩ කාමරය සඳහා 03 වන ලංසුව ඉදිරිපත් කර තිබූ බෙන්තොට,දෝපෙ,නො 116 A පදිංචි වළාකුළුගේ දෝන ජිවන්ති අබේවික්‍රම යන අය විසින් එම කඩ කාමරය සඳහා පළමු වන ලංසුකරු හා දෙවන ලංසුකරු බදු ගැනීම හා ඉදිරිපත් නොවන්නේ නම් දෙවන ලංසුකරු ඉදිරිපත් කර තිබූ රු:1,455,000/= ක ලංසු මුදලම කඩ කාමරය බදු ගැනීම සඳහා කැමැත්ත පල කරමින් 2025.12.03 දිනැතිව ඉල්ලීමක් කර තිබුණි. එම ඉල්ලීම් පිළිබඳ සලකා බැලූ කමිටුව 2025/11/11 දිනැති ප්‍රසම්පාදන තිරණ අංක 01 IV අනුව තීරණය කළ පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමටත් වළාකුළුගේ දෝන ජිවන්ති යන අය විසින් කරන ලද 2025.12.03 දිනැති ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>15. ගබඩාව සඳහා අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදි ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

මිල ගණන් කැඳවූ කාල සීමාව 2025/11/26 – 2025/12/12

| අනු අංකය | ද්‍රව්‍ය හෝ භාණ්ඩ විස්තරය | අවශ්‍ය බර/දිග ඒකක ප්‍රමාණය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන හා ඒකක මිල (රු) | | |
|---|---|---|---|---|---|
| | | | Sri lanka State Trading Corporation ltd, Matara | Epic International (pvt)ltd, Hadigama, piliyandala | St Anthony's Manuffacurers & Meerchants(pvt)ltd,Colombo 14 |
| 1 | කොමඩ් බ්‍රෂ්(ප්ලාස්ටික් කෙදි සහිත) | 15 | 262.67(only brush)<br>482.67(with caddy) | 184.08 | 286.00 |
| 2 | විම් සබන් කැට | 10 | 683.63(100g)<br>122.72(200g) | - | - |
| 3 | ප්ලාස්ටික් කොසු | 20 | 606.66(plastic) | 323.32 | 418.75 |
| 4 | මොප් | 10 | 878.66 | 346.92 | 431.25 |
| 5 | වයිපර් | 12 | 557.34(with stick) | 293.82 | 718.25 |
| 6 | කොහු සහිත කොසු | 12 | - | 323.32 | 273 |
| 7 | රබර් අත්වැසුම් යුගල | 150 | 540.00(elbow length)<br>895.00(sholder length) | 453.12<br>594.72 | 252 |
| 8 | ගම් බූට් | 15 | 1475.00(with out metal)<br>2615.00(with metal) | 1770.00 (12")<br>2124.00 (16") | - |
| 9 | ලයිසෝල් | 15 | 420.00(harpic 500ml) | 489.70 | 431.82 |
| 10 | හාපික් | 12 | 355.00(briyol 475ml) | 423.62 | 371.36 |

ලියාපදිංචි ආයතන 03ක් වෙතින් මිල ගණන් ඉදිරිපත් කර තිබුනි. අදාල මිල ගණන් සලකා බැලූ කමිටුව එම මිල ගණන් අතරින් අයිතම අංක 02,08 (with out metal gum boot) 09 හා 10 සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ මාතර දුම්රියපොල පාර, පිහිටි සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ නිතිගත සංස්ථාව වෙතින් මිලදී ගැනීමටත්, අයිතම අංක 01,03,04,05,හා 07 (12" rubber gloves) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ පිළියන්දල,හැඩිගම පිහිටි Epic International (පුද්) සමාගම වෙතින් ගබඩාව වෙත ඉල්ලුම්කරන ලද නියමිත ප්‍රමාණයන් යටතේ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටිවු ඒකමතිකව තීරණය කරන ලදි.

**16.දෙද්දුව පන්සල පාරේ හරස් පාර පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත දෙද්දුව පන්සල පාරේ හරස් පාර පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීමට කහගල්ල සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය, දෙද්දුව සරුකෙත ගොවි සංවිධානය, අංගාගොඩ - පිටාරඹ ජොෂ්ඨ පුරවැසි සමිතිය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම් හි ශායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව අංගාගොඩ - පිටාරඹ ජොෂ්ඨ පුරවැසි සමිතිය වටිනාකම රු.2,000,000.00 ක් වූ බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීමේ ව්‍යාපෘතිය

- අදියර II මේ වන විටත් සිදු කරමින් පවතින අතර තවදුරටත් යාබද ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාකාරී ප්‍රජා පාදක සමිතියක් වුවත් ව්‍යාපෘතිය දෙද්දූව කොට්ඨාසයේ වන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිර්දේශ කර නොමැත. කහගල්ල සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය ද යාබද ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාකාරී ප්‍රජා පාදක සමිතියක් වුවද ව්‍යාපෘතිය දෙද්දූව කොට්ඨාසයේ වන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිර්දේශ කර නොමැත. දෙද්දූව සරුකෙත ගොවි සංවිධානය මේ වන විට වටිනාකම රු. 526,321.30ක් වන දෙද්දූව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිරිපස වහළ සෑදීමේ ව්‍යාපෘතිය හා වටිනාකම රු. 860,729.87ක් වන විලියම් ගුණරත්න මාවත කොටසක් කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතීන් සිදු කරමින් පවතින අතර අප ආයතනය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත දෙද්දූව පන්සල පාරේ හරස් පාර පිළිසකර කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල වන රු. 610,040.06ක මුදල ද සමඟ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ මඟින් නිර්දේශ කර ඇති පරිදි දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල ඉතිරි කොටස් වල සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ සමස්ථ වටිනාකම රු.මිලියන දෙක නොඉක්මවන බැවින් හා එක් අවස්ථාවක දී ප්‍රජා පාදක සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට වඩා වැඩි නොවැඩි වන බැවින් දෙද්දූව පන්සල පාරේ හරස් පාර පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය දෙද්දූව සරුකෙත ගොවි සංවිධානයට පිරිනැමීම ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>17.කනහින්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබා දීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම.</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කනහින්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබා දීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීමට ඇලකාක ගොවි සංවිධානය, ඇතුන්ගාගොඩ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම් හි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව ඇතුන්ගාගොඩ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය මේ වන විට ගිවිසුම් අත්සන් කර දැනට කර ගෙන යන ව්‍යාපෘතීන් හි සමස්ථ වටිනාකම රු.මිලියන දෙක ඉක්මවන බැවින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ද නිර්දේශ කර ඇති ඇලකාක, හබුරුගල ප්‍රගති ගොවි සංවිධානය කනහින්තොට ගම්සභා පාර පවත්නා ජල ටැංකියේ සිට ගම්වාසීන්ට ජලය ලබා දීමේ ව්‍යාපෘතිය සිදු කිරීමට තෝරා ගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>18.අංක 40 - කුඩා ඌරගහ දිද්දුගොඩ සිට බටදූව දක්වා යා කොරන අතුරුමාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත අංක 40 - කුඩා ඌරගහ දිද්දුගොඩ සිට බටදූව දක්වා යා කොරන අතුරුමාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීමට කුඩා ඌරගහ සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය, කුඩා ඌරගහ ගොවි සංවිධානය හා කුඩා ඌරගහ ග්‍රාම සංවර්ධන සමිතිය විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර හා බැංකු ගිණුම් හි ඡායා පිටපත් ඉදිරි කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව කුඩා ඌරගහ ගොවි සංවිධානය මේ වන විට රු.222,865.20ක් වටිනා කඳන් ගොවිපල දෙපා ඇල ප්‍රතිසංස්කරණය කරමින් පවතින අතර කුඩා ඌරගහ සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය හා කුඩා ඌරගහ ග්‍රාම සංවර්ධන සමිතිය අතරින් වැඩි බැංකු ගිණුම් ශේෂයක් ඇති කුඩා ඌරගහ ග්‍රාම සංවර්ධන සමිතිය **අංක** 40 - කුඩා ඌරගහ දිද්දුගොඩ සිට බටදූව දක්වා යා කොරන අතුරුමාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා තෝරා ගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>19.නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමණාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ඝන අපද්‍රව්‍ය කළමණාකරණය - නව වැඩ අංශය යටතේ ප්‍රතිපාදන අනුමතව ඇති නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමණාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීමට දෝපේ සමෘද්ධි සමිතිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමේ ලිපිය, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍රය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

එහි දී දෝපේ සමෘද්ධි සමිතිය මින් පෙර ව්‍යාපෘති කර නොමැති නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් නිර්දේශ කර ඇති බැවින් තාක්ෂණ සේවා සෘජු අධීක්ෂණය යටතේ සිදු කිරීමට යටත්ව (ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට නියමිත දැල් ආවරණ වෙල්ඩින් වැඩ සිදු කරනු ලබන කාර්මික මහතෙක් සිදු කරන බැවින් ද ව්‍යාපෘතිය කඩිනමින් කිරීමේ අවශ්‍යතාවය පවතින බැවින් හා බල ප්‍රදේශයේ සමිති වලට අවස්ථාවක් දීමේ පරමාර්ථ කොට) නොදිරන අපද්‍රව්‍ය රැස් කිරීම හා කළමණාකරණය සිදු කරනු ලබන ගොඩනැගිල්ල කොටස්වලට බෙදා වෙන් කිරීමේ ව්‍යාපෘතිය දෝපේ සමෘද්ධි සමිතියට ලබා දීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>20.සිල්වර් ගාර්ඩ්න් ඉඩමෙහි පානීය ජල ව්‍යාපෘතිය සිදු කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - සංශෝධන යටතේ ප්‍රතිපාදන අනුමතව ඇති සිල්වර් ගාර්ඩ්න් ඉඩමෙහි පානීය ජල ව්‍යාපෘතිය සිදු කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම සඳහා මහගොඩ සමෘද්ධි ගොවි සංවිධානය, මහගොඩ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය හා වියන්දූව පැරකුම් ගොවි සංවිධානය විසින් ඉල්ලීමේ ලිපි, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍ර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව ඉහත සමිති තුනම සක්‍රීය සමිති වන බවට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් තහවුරු කර ඇති අතර මහගොඩ සමෘද්ධි ගොවි සංවිධානය මින් පෙර කර්මාන්ත සිදු කර නොමැති බැවින් හා මූල්‍ය ධාරිතාවය සැලකූ විට ඉහළ ධාරිතාවයක් ඇති මහගොඩ සමෘද්ධි ගොවි සංවිධානයට සිල්වර් ගාර්ඩ්න් ඉඩමෙහි පානීය ජල ව්‍යාපෘතිය ලබා දීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

**<u>21.බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලීය භූමියේ අමතර ප්‍රවේශය, ගේට්ටු සහ වැට සැකසීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම</u>**

සභා අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලීය භූමියේ අමතර ප්‍රවේශය, ගේට්ටු සහ වැට සැකසීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ප්‍රජා පාදක සමිතියක් තෝරා ගැනීම සඳහා දෝපේ උපස්ථායක සමිතිය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමේ ලිපිය, අනුමත සමිති වල කුඩා පරිමාණයේ (ඉදිකිරීම්/ මාර්ග/වෙනත්) කොන්ත්‍රාත් ලබා ගැනීමේ අයදුම්පත්‍රය, බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ බෙන්/6/1/11 හා 2025.12.12 දිනැති ලිපිය හා අංගාගොඩ පිටාරඹ වැඩිහිටි සමිතිය විසින් උක්ත කර්මාන්තය දෝපේ උපස්ථායක වැඩිහිටි සමිතිය විසින් සිදු කිරීම පිළිබඳව විරෝධතාවයක් නොමැති බවට වූ ලිපිය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

එහි දී ප්‍රසම්පාදන කමිටුව විසින් පහත කරුණු පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. මේ වන විට උක්ත ව්‍යාපෘතිය පවතින අංගාගොඩ වසමේ බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහළ හා ඉතිරි අලුත්වැඩියාවන් සිදු කිරීම - අදියර I සහ II ව්‍යාපෘති සඳහා පිළිවෙලින් අංගාගොඩ පිටාරඹ ජ්‍යෝෂ්ඨ පුරවැසි සමිතිය සහ අංගාගොඩ සමෘද්ධි සමිතිය අප සභාව සමඟ ගිවිසුම්ගතව වැඩ කරමින් පවතී. වසමේ වෙනත් පෙර පලපුරුදු සහිත වෙනත් ක්‍රියාකාරී සමිති නොමැති බැවින් හා බෙන්තොට ප්‍රාදේශීය ලේකම්ගේ බෙන්/6/1/11 හා 2025.12.12 දිනැති ලිපිය මඟින් ආසන්න වසම වන දෝපේ ග්‍රාම නිලධාරී වසමේ වැඩිහිටි සමිතිය ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ගිවිසුම් ගැනීමට සුදුසු බවට නිර්දේශ කර ඇති බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලීය භූමියේ අමතර ප්‍රවේශය, ගේට්ටු සහ වැට සැකසීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා දෝපේ ග්‍රාම නිලධාරී වසමේ වැඩිහිටි සමිතිය තෝරා ගැනීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. ලෙනිකා දූශාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රී
3. පුණ්‍ය ශ්‍රී ලාල් මැතිතුමා - ගරු මන්ත්‍රී
4. උඩබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.12.12 දින පැවති  ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.5. 2025.12.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>2025.12.19 දින පෙ.ව.9.00ට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගීත්වය

1. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
2. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
3. ඩී.ඩී.නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී
4. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
5. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී

**ගෙවීම් නිර්දේශ කිරීම.**

පහත සඳහන් ගෙවීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | 135 | Sarasavi Book Shop (PVT) LTD | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා පොත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම | 468,232.15 |
| 02 | 136 | දයාවංශ ජයකොඩි සහ සමාගම | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා පොත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම | 317,016.00 |
| 03 | 137 | ඇම්.ඩී.ගුණසේන සහ සමාගම | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සඳහා පොත් මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම | 179,243.40 |
| 04 | 139 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 ආයුර්වේද ජංගම සේවා විශේෂ වැඩසටහන සඳහා මිලදීගනු ලැබූ ආයුර්වේද ඖෂධ සඳහා ගෙවීම. | 59,995.50 |
| 05 | 140 | මුදල් භාරකරු පී.එච්.ටී.කේ.හේමචන්ද්‍ර | 2025/12/23 විවෘත කිරීමට නියමිත ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට අත්පිට මුදලින් වියදම් දරා මිලදීගත යුතු ද්‍රව්‍ය වෙනුවෙන් අත්තිකාරම් ලබාගැනීම. | 100,000.00 |
| 06 | 141 | පී.ඩී.දීපා ප්‍රියංගනී | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 516.00 |
| 07 | 142 | එම්.ඩබ්.අජිත් කුමාර | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 ජනවාරි/ ඔක්තෝම්බර්/ නොවැම්බර් | 1697.50 |
| 08 | 143 | ආර්.ජේ.එස්.මාදුවාගොඩ | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 500.00 |
| 09 | 144 | ප්‍රේමකුමාර විජේවර්ධන | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 නොවැම්බර් | 5,000.00 |
| 10 | 145 | කේ.කේ.එන්.එම්.රණවීර | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 588.00 |
| 11 | 146 | පී.කේ.හෂාන් චමිල කුමාර | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 ජනවාරි/ ඔක්තෝම්බර්/ නොවැම්බර් | 1,940.00 |
| 12 | 147 | කේ.අජිත් ජයරත්න | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 නොවැම්බර් ,දෙසැම්බර් | 4,000.00 |
| 13 | 148 | එම්.කේ.වසන්තා ප්‍රියදර්ශනී | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 516.00 |
| 14 | 149 | ටී.ජී.ගීතිකා ලක්මාලි | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 480.00 |
| 15 | 150 | එන්.ටී.ඒ.ජේ.ද සිල්වා | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 දෙසැම්බර් | 800.00 |
| 16 | 151 | එම්.කේ.වසන්තා ප්‍රියදර්ශනී | ගමන් වියදම් දීමනා ගෙවීම.2025 නොවැම්බර් | 1,792.00 |
| 17 | 152 | එම්.ඒ.අමල් | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 3,064.66 |
| 18 | 153 | කේ.යූ.සාගර | අතිකාල දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 15,403.33 |
| 19 | 154 | ආර්.ජේ.එස්.මාදුවාගොඩ | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 9,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 20 | 155 | පී.ඩී.දීපා ප්‍රියංගනී | පරිවර්තිත ගමන් වියදම් දීමනා ගෙවීම. 2025 නොවැම්බර් | 8,000.00 |
| 21 | 156 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැලසුම් කමිටුවට සහභාගී වීම වෙනුවෙන් දීමනා ගෙවීම.2025.11.21, 2025.12.05, 2025.12.09 | 56,250.00 |
| 22 | 157 | මුදල් භාරකරු<br>පී.ඩී.දීපා ප්‍රියංගනී | කසල අංගනයේ වෙන්කරනු ලබන ප්ලාස්ටික්, වීදුරු බෝතල් හා පොලිතීන් බහාලීමට පොහොර කවර මිලදීගැනීම සඳහා අත්තිකාරම් මුදල් ලබාගැනීම. | 25,000.00 |
| 23 | 158 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | සැලසුම් කමිටුවට සහභාගී වීම වෙනුවෙන් දීමනා ගෙවීම.2025.12.18 | 16,750.00 |
| 24 | 159 | මුදල් භාරකරු<br>ඩී.ඩී.සතාරා නදීශානි | 2025.12.09 දින මැහුම් කටයුතු කළ කණ්ඩායම සඳහා ආහාර ලබාදීම වෙනුවෙන් අතින් දරන ලද මුදල ප්‍රතිපූර්ණය කිරීම. | 3,200.00 |
| 25 | 160 | මුදල් භාරකරු<br>ටී.ඒ.එම්.ගුණරත්න | ඉවත ලද ද්‍රව්‍යවලින් අත්කම් නිර්මාණය හා දසපැන වැඩසටහන සඳහා සංග්‍රහ වෙනුවෙන් අතින් වියදම් වූ මුදල් ලබාගැනීම. | 1,860.00 |
| 26 | 161 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | නුපුහුණු සේවකයින් සඳහා දෛනික වැටුප් ගෙවීම. | 81,200.00 |
| 27 | 162 | මුදල් භාරකරු<br>ආර්.ජේ.එස් මාදුවාගොඩ | හොරවල දෙද්දුගෙවත්ත අද්දරවෙල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ ඍජු ශ්‍රමය යටතේ සිදු කිරීමට අදාළ නුපුහුණු ශ්‍රමිකයින් යොදා ගැනීමට අත්තිකාරම් ලබාගැනීම. | 17,400.00 |
| 28 | 163 | මුදල් භාරකරු<br>කසුන් උදාර ගුණසේකර | පෞද්ගලික ලිපිගොනු විෂයට අවශ්‍ය පොදු ආකෘති පත්‍ර මිලදීගැනීම සඳහා රජයේ මුද්‍රණාලයේ බිල්පත වෙනුවෙන් අත්පිට මුදල් ගෙවීම ප්‍රතිපූර්ණය කිරීම. | 5,310.00 |
| 29 | 164 | මුදල් භාරකරු<br>බෙන්තොට ප්‍රාදේශීය සභාව | තාක්ෂණ ප්‍රගති සමාලෝචන කමිටු සහභාගීත්ව දීමනාව ගෙවීම. | 10,000.00 |
| 30 | 165 | මුදල් භාරකරු<br>ඩබ්.සෙනාලි තිසරණී | පරිගණක පුහුණුව දීමනාව ගෙවීම.<br>2025 ජූලි/ අගෝස්තු /සැප්තැම්බර්/ ඔක්තෝම්බර්/ නොවැම්බර් | 92,000.00 |
| 31 | 166 | මුදල් භාරකරු<br>කේ.ඒ.ප්‍රභා මධුෂානි | හොරවල දෙද්දුගෙවත්ත අද්දරවෙල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ඍජු ශ්‍රමය යටතේ සිදු කිරීමට අදාල පුහුණු ශ්‍රමිකයින් ලබාගැනීමට අදාලව අත්තිකාරම් ලබාගැනීම. | 11,400.00 |
| 32 | 167 | Hansagiri Petroleum (PVT) LTD | ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.11.11 – 2025.12.03 | 180,179.17 |
| 33 | 168 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.11.24 – 2025.11.27 | 110,130.00 |
| 34 | 169 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය,බේරුවල | ඉන්ධන බිල්පත් පියවීම.<br>2025.12.01 – 2025.12.03 | 172,212.00 |
| 35 | 170 | ලංකා විදුලිබල මණ්ඩලය | කනහින්තොට බිලුමවුන්ටන් පොදු ළිඳේ ජල පොම්පාගාරයේ විදුලි බිල ගෙවීම. | 717.95 |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2025.11.07 – 2025.12.08 | |
| 36 | 171 | ලංකා විදුලිබල මණ්ඩලය | ආදාහනාගාරයේ,අංගාගොඩ පෙර පාසලේ,පියවර පෙර පාසලේ විදුලි බිල ගෙවීම. | 6,794.87 |
| 37 | 172 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | බෙන්තොට මහජන පුස්තකාලයේ, ආදාහනාගාරයේ, අංගාගොඩ පෙර පාසලේ ජල බිල්පත පියවීම. | 3,477.07 |
| 38 | 173 | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ඉඳුරුව උප කාර්යාලයේ ජල බිල්පත පියවීම. 2025.10.28 – 2025.11.30 | 34,435.48 |
| 39 | 174 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | ඉඳුරුව උප කාර්යාලයේ ජල බිල්පත පියවීම. 2025.11.01 – 2025.11.30 | 2,880.10 |
| 40 | 175 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී | 034-2275419 දුරකතනයේ බිල්පත හා 034-2290646 දුරකතනයේ බිල්පත පියවීම | 15,385.74 |
| 41 | 176 | ලංකා බැංකුවේ යූ.කේ.සී.එම්.මධුෂංක ගි.අ. 8489735 | කසල අංගනය ඇතුළත මාර්ගයට කොරිපස් කියුබ් 4ක් යොදා මාර්ගය පිළිසකර කිරීම වෙනුවෙන් ගෙවීම. | 48,000.00 |
| 42 | 177 | ලංකා බැංකුවේ යූ.කේ.සී.එම්. මධුෂංක ගි.අ. 8489735 | කසල අංගනයේ කසල තුනී කිරීම හා කෙළවරට තල්ලු කිරීම සඳහා PC 46 ස්කුවේටර් යන්ත්‍රය ලබාගැනීම වෙනුවෙන් බිල්පත පියවීම | 187,000.00 |
| 43 | 178 | මුදල් භාරකරු ඩී.ඩී.එස්.නදීශානි | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා විදුලි පහන් උපකරණ උපාංග, අමතර කොටස් හා අලංකරණ කටයුතු සඳහා අවශ්‍ය අයිතමයන් මිලදීගැනීම සඳහා අත්තිකාරම් ලබාගැනීම | 100,000.00 |
| 44 | 179 | කුඩා ඌරගහ සමුපකාර ග්‍රාමීය බැංකුවේ ධර්ම විජය ග්‍රාම සංවර්ධන සමිතිය ගි.අ. 25352 | මහ ඌරගහ මාතෘ සායන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම් සිදු කිරීම | 450,000.00 |
| 45 | 180 | මුදල් භාරකරු ටී.ජී.ගීතිකා ලක්මාලි | බෙන්තොට ප්‍රාදේශීය සභා නව කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය වෙනුවෙන් වියදම් දැරීම සඳහා අත්තිකාරම් ලබාගැනීම. | 100,000.00 |
| 46 | 181 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 දෙසැම්බර් | 5,292,033.21 |
| 47 | 182 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | ස්ථිර වැටුප් ගෙවීම. 2025 දෙසැම්බර් | 1,019,370.68 |
| 48 | 183 | Pure Spheres Private Limited | ප්‍රාදේශීය සභා කසල අංගනය සඳහා දුර්ගන්ධ පාලන ද්‍රාවණ හා මැස්සන් පාලන ද්‍රාවණ මිලදීගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 26,700.00 |
| 49 | 184 | නිව් ජයමාල් හාඩ්වෙයාර් | කැනපි වට්ටු පේන්ට් කිරීම සහ ගලි බවුසරයේ බට සවි කිරීමට අවශ්‍ය Hose clip මිලදීගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 14,400.00 |
| 50 | 185 | U.K.G. Enterprises | සභාවේ ගලි බවුසරය සඳහා මිලදීගත් Suction Hose 40m වෙනුවෙන් ගෙවීම් කිරීම. | 63,800.00 |
| 51 | 186 | පළාත් පාලන කොමසාරිස් | ආපදා හානියට පත් දිස්ත්‍රික්කවල සහන සේවා සැපයීම සඳහා ලබාදුන් මුදල්වලින් ඉතිරි මුදල ගෙවීම. | 455,989.30 |

| | | | | |
|---|---|---|---|---|
| 52 | 187 | F.H. Tools Center | ආදාහනාගාරය වෙත මිලදීගත් DBL තණකොළ කපන යන්ත්‍රය සඳහා ගෙවීම් කිරීම. | 21,000.00 |
| 53 | 188 | LC Printers & Advertising (PVT) Ltd | ආපදා සහන සේවා කණ්ඩායමේ රථවාහන සඳහා ප්‍රදර්ශනය කිරීමට 4'x2' ප්‍රමාණයේ Flex බැනර් 08ක් මුද්‍රණය කරගැනීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 10,800.00 |
| 54 | 189 | LC Printers & Advertising (PVT) Ltd | 2025 වාර්ෂික පෙර පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය සහතික පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 7,500.00 |
| 55 | 190 | බෙන්තොට දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ අංගාගොඩ සමෘද්ධි සමිතිය ගි.අ.02/30059 | බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල හා ඉතිරි අළුත්වැඩියාවන් වෙනුවෙන් ගෙවීම. | 1,476,736.99 |
| 56 | 191 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් සිලින්ඩර් 05ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 82,960.00 |
| 57 | 192 | ජයසේකරගේ කරුණාදාස | බෙන්තොට මද්දෙවෙල ආදාහනාගාරය සඳහා 37.5kg ගෑස් සිලින්ඩර් 05ක් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 82,960.00 |
| 58 | 193 | මහජන බැංකුවේ ඩබ්.ඩී.කමල් රෝහිත ගි.අ.197200100028258 | 2025.12.12 දින පුස්තකාල සඳහා ග්‍රන්ථ රැගෙන ඒමට කොළඹ, නුගේගොඩ ප්‍රදේශවලට යාම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 20,000.00 |
| 59 | 194 | Induruwa car care service | 252- 6569 දරණ කැබ් රථයේ වාර සේවාව සිදු කිරීමට අදාල බිල්පත පියවීම. | 38,420.00 |
| 60 | 195 | මුදල් භාරකරු සී.අයි.ඩී.ඒ.වීරසේකර | 2025.12.05 දින වවුචර් අංක 40 යටතේ මහ සභාවේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් ලබාගත් අත්තිකාරම පියවීම. | (15,000.00) |
| 61 | 196 | බෙන්තොට ලංකා බැංකුව | නිත්‍ය නියෝග මඟින් ගෙවීම් පහසුකම ලබාගැනීමේදී ආරම්භක ගාස්තුවක් අය කිරීම වවුචරයක් මඟින් පියවීම. | 250.00 |
| 62 | 197 | මුදල් භාරකරු කාර්යභාර නිලධාරි, ඉඳුරුව | 2025.09.26 දින වවුචර් අංක 161 මඟින් ලබාගත් සුළු මුදල් අත්තිකාරම පියවීම. | (5,000.00) |
| 63 | 198 | K.V.I.S. Kumarasinghe | හබුරුගල උප කාර්යාලයට අයත් අංක BPS/SO/HAB/PC/02 දරණ පරිගණකය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම. | 31,000.00 |
| 64 | 199 | K.V.I.S. Kumarasinghe | ගි/05 විෂය භාරව පවතින BPS/ACC/PC/05 පරිගණකය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම. | 31,000.00 |
| 65 | 200 | ලංකා බැංකුවේ බී.ඩී.කේ.මධුසංක ගි.අ.4930277 | JR 7724 ත්‍රීරෝද රථයේ සිදුකළ අළුත්වැඩියාවට අදාළ බිල්පත ගෙවීම. | 19,100.00 |
| 66 | 201 | Local Loans and Development fund | බෙන්තොට පොදු වෙළඳපොළ සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් ණය මුදලෙන් 2025 දෙසැම්බර් මස වාරිකය හා පොලිය ස්ථාවර නියෝගයකින් ගෙවීම. | 229,408.36 |

| | | | | |
|---|---|---|---|---|
| 67 | 202 | Local Loans and Development fund | ගෝනගල පොදු වෙළඳපොළ සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම් ණය මුදලෙන් 2025 දෙසැම්බර් මස වාරිකය හා පොළිය ස්ථාවර නියෝගයකින් ගෙවීම. | 425,515.24 |
| 68 | L02 | ලංකා බැංකුවේ<br>එම්.ඒ.අමල්<br>ගි.අ.92739936 | ආපදා ණය ගෙවීම. | 400,000.00 |
| 69 | 203 | මුදල් භාරකරු<br>ඩී.ඩී.ආර්.එස් වික්‍රමරත්න | 2025.12.08 දින වවුචර් අංක 68 යටතේ සභාවට අයත් RX 0099, RD 6208, PF 7388, 252-6569 වාහන සඳහා 2025/2026 වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍ර, දුම් පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා ලබාගත් අත්තිකාරම පියවීම. | (30,880.00)<br>580.00 |
| 70 | | දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ වරකමුල්ල සමෘද්ධි සමිතිය ගි.අ. 15/30064 | මහ ඉඳුරුව, කහවෙගම්මැද්ද මහවත්ත මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් මුදල ගෙවීම. | 1,449,917.81 |
| 71 | 244 | මුදල් භාරකරු<br>සී.අයි.ඩී.ඒ වීරසේකර | 2026.01.13 දින පැවැත්වීමට නියමිත බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම. | 15,000.00 |
| 72 | 218 | ජාතික රක්ෂණභාර අරමුදල | LL 7293 හා LL 7067 යන වාහන 2025/2026 වර්ෂය සඳහා තෙවන පාර්ශවයේ රක්ෂණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,839.34 |
| 73 | 217 | ජාතික රක්ෂණභාර අරමුදල | PF 7388 කැබ් රථය 2025/2026 වර්ෂය සඳහා පූර්ණ රක්ෂණය කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 61,405.99 |
| 74 | 219 | මහජන බැංකුවේ එම්.වී.පී. ප්‍රේමතිලක ගි.අ. 148200190043508 | සභාව සතු කැනපි අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම. | 123,000.00 |
| 75 | 216 | The Associated Newspapers of Ceylon Limited | 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් සහ බෙන්තොට ප්‍රාදේශීය සභා වෙළඳ සංකීර්ණයේ කඩකාමර 2026 වර්ෂයේ සිට දීර්ඝකාලීන බදුදීම වෙනුවෙන් දිනමිණ පුවත්පතේ දැන්වීම් 2 ක් පළකිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 139,122.00 |
| 76 | 215 | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 20 W IP 65 (Dimo) බල්බ 500 ක් සඳහා ගෙවීම් කිරීම. | 675,000.00 |
| 77 | 207 | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | 2025 වාර්ෂික පෙර පාසල් ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය පාසල් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 127,301.50 |
| 78 | 208 | ලංකා බැංකුවේ බී.එච්.එන්. මැණිකේ ගි.අ.72452461 | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පියවර පෙර පාසලේ දරු දැරියන් සඳහා 2025 ඔක්තෝම්බර් මස ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 6,300.00 |

| | | | | |
|---|---|---|---|---|
| 79 | 209 | ලංකා බැංකුවේ ජී.ඊ. කෞශල්‍යා ගි.අ.91612625 | බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මල්මඩුවාකන්ද පෙර පාසලේ දරු දැරියන් සඳහා 2025 ඔක්තෝම්බර් මස ක්‍රියාත්මක කරන ලද පෝෂණ වැඩසටහනට අදාළ මුදල් ප්‍රතිපූර්ණය කිරීම. | 25,280.00 |
| 80 | 211 | එච්.ඩී.මෙත්තානන්ද | බෙන්තොට මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 නොවැම්බර් | 14,880.00 |
| 81 | 210 | එච්.ඩී.මෙත්තානන්ද | හබුරුගල මහජන පුස්තකාලයේ හා තුන්දූව කියවීම් ශාලාවේ පුවත්පත් බිල පියවීම. 2025 නොවැම්බර් | 15,840.00 |
| 82 | 212 | සතර පොත්හල | ඉඳුරුව මහජන පුස්තකාලයේ පුවත්පත් බිල පියවීම. 2025 නොවැම්බර් | 14,730.00 |
| 83 | 213 | ලංකා බැංකුවේ පී.එච්. මනෝජිත් ගි.අ.2051894 | හබුරුගල උප කාර්යාලයේ විදුලි කේතලය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 2,000.00 |
| 84 | 214 | Brown & Company PLC | RE 9232 ට්‍රැක්ටර් රථයේ බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. | 98,808.98 |
| 85 | K04 | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මිරිස්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය ගි.අ. 215011500121 | මිරිස්වත්ත නිල සෙවණ ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම. | 536,337.71 |
| 86 | K05 | ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශක්ති වැඩිහිටි සමිතිය ගි.අ. 215011500090 | මහ ඉඳුරුව අකාඩේගොඩ මැදගොඩ පාර තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම. | 1,095,171.38 |

01. පිටු අංක 130 සිට 137 දක්වා වූ අංක 01 සිට 86 දක්වා වන වවුචර් පරීක්ෂා කොට අනුමැතිය සඳහා නිර්දේශ කරමු.

02. 2025.12.18 දිනැතිව "RE 9232 ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටරය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටරය අක්‍රීය වී ඇති බැවින් හා කසල ඇදීමේ රාජකාරි සඳහා මෙම ට්‍රැක්ටර් රථයේ ස්ටාටර් මෝටරය ඉතා ඉකමනින් අලුත්වැඩියා කරගත යුතු බැවින් කළුතර නාගොඩ පිහිටි Top Cool AC & Mechanic ආයතනය වෙත යොමුකර පරීක්ෂා කරන ලද අතර එම ආයතනය විසින් මෙම අලුත්වැඩියාව සඳහා රු.18,000.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති අතර එම ඇස්තමේන්තුව යටතේ මෙම අලුත්වැඩියාව කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව RE 9232 ට්‍රැක්ටර් රථය කළුතර නාගොඩ පිහිටි Top Cool AC & Mechanic ආයතනයෙන් රු.18,000.00 ක ඇස්තමේන්තු මුදල යටතේ සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

03. 2025.12.16 දින "නවීකරණය කරනු ලබන ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ලට අවශ්‍ය අමතර උපාංග ලබා ගැනීම" යන මැයෙන් යුතුව බෙන්තොට තාක්ෂණ සේවා නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල සඳහා පහත උපාංග අවශ්‍ය බැවින් එම උපාංග කඩිනමින් ලබාදෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

- සිවිලිං පැනල් ලයිට් 18 W - 20
- Wall ලයිට් 20W - 05
- සිවිලිං විදුලි පංකා - 07
- තාප්පයට සවි කරනු ලබන ලයිට් - 06

ඒ අනුව ඉහත සඳහන් උපාංග කඩිනමින් ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

04. 2025.12.18 දින “සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026” මැයෙන් යුතුව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2026 වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2025.12.10 දින අවසන් වූ අතර එම දිනට පසුව පහත නම් සඳහන් ආයතන 03 ලියාපදිංචි වීමට ඉල්ලුම්පත් යොමු කර ඇත.

| ආයතනයේ නම | ඉල්ලුම් කර ඇති අයිතම අංකය හා විස්තරය |
|---|---|
| 01.Gesterner of Ceylon PLC<br>No.248, Vauxhall Street, Colombo 02 | No. 08 - කාර්යාලීය මුද්‍රණ කටයුතු සඳහා ටෝනර්, ඉන්ක්, කාට්රිජ්, රිබන් සැපයීම.<br>No. 10 - කාර්යාලීය පරිගණක හා උපාංග සැපයීම.<br>No. 12 - පරිගණක මෘදුකාංග (Software) හා පරිගණක ආරක්ෂක මෘදුකාංග (Virus Guard) සැපයීම. |
| 02.Fintek Managed Solution (PVT)LTD<br>No.248, Vauxhall Street, Colombo 02 | No. 08 - කාර්යාලීය මුද්‍රණ කටයුතු සඳහා ටෝනර්, ඉන්ක්, කාට්රිජ්, රිබන් සැපයීම.<br><br>No. 10 - කාර්යාලීය පරිගණක හා උපාංග සැපයීම.<br>No. 12 - පරිගණක මෘදුකාංග (Software) හා පරිගණක ආරක්ෂක මෘදුකාංග (Virus Guard) සැපයීම. |
| 03.Avonsmart Engineering (PVT) LTD<br>Station Road, Kelaniya | No. 42 - වාහන සේවා කිරීම හා ඔයිල් වර්ග සැපයීම.<br>No. 43 - වාහන අලුත්වැඩියා කිරීම. |

ඒ අනුව උක්ත සඳහන් ආයතන 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කිරීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

05. 2025.12.19 දිනැතිව ගි/07 විෂයභාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

06. 2025.12.02 දිනැතිව "RD 4484 දරණ ට්‍රැක්ටර් රථය සඳහා නව බැටරියක් මිලදී ගැනීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත අංක දරණ ට්‍රැක්ටරය සඳහා අවසන් වරට බැටරියක් යොදා අවු.06 කට අධික කාලයක් ධාවනය කර ඇති බැවින් මෙම ට්‍රැක්ටරයට නව බැටරියක් සවි කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත අංක දරණ ට්‍රැක්ටර් රථය සඳහා නව බැටරියක් මිලදී ගැනීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

07. 2025.12.15 දින "LD 8614 දරණ රථයේ අලුත්වැඩියාව හා වාර සේවාව සිදු කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව LD 8614 රථයේ වාර සේවාව සිදුකිරීමට කාලය එළඹ ඇති බැවින් එම සේවාව Induruwa Car Care Service ආයතනය මඟින් සිදුකිරීමටත් ස්පීඩෝ මීටරය අළුතින් සවි කිරීමට,වම්පස පැති කණ්ණාඩිය,දකුණුපස ඉදිරි මඩ පුවරුව අළුතින් දැමීම හා ටර්බෝ පද්ධතිය අලුත්වැඩියා කිරීමට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි අතුරුවැල්ල සසිඳු මෝටර්ස් මඟින් සිදුකිරීමටත් අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා ඇත. ඒ අනුව උක්ත රථයේ වාර සේවාව Induruwa Car Care Service ආයතනය මඟින් සිදුකිරීමටත් ස්පීඩෝ මීටරය අලුතින් සවි කිරීම ඇතුළු අනෙකුත් අලුත්වැඩියාවන් සභාවේ ලියාපදිංචි අතුරුවැල්ල සසිඳු මෝටර්ස් ආයතනයෙන් සිදුකිරීමටත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

08. 2025.12.18 දින "252-6569 කැබ් රථය අලුත්වැඩියා කිරීම" යන මැයෙන් යුතුව සං/02 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව උක්ත අංක දරණ කැබ් රථයේ සස්පෙන්ෂන් බෝල ජොයින්ට් 04 සහ ස්ටීරියන් බෝල ජොයින්ට්,ආම් බුෂ් අලුත්වැඩියා කල යුතු බැවින් එම අලුත්වැඩියාවන් සභාවේ ලියාපදිංචි සසිඳු මෝටර්ස් මඟින් සිදුකිරීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව උක්ත සඳහන් අලුත්වැඩියාවන් සභාවේ ලියාපදිංචි සසිඳු මෝටර්ස් ආයතනයෙන් සිදුකිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

09. 2025.12.18 දින "නව පරිගණක මිලදී ගැනීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව ගි/05 විෂයභාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාව සඳහා අලුතින් මිලදීගනු ලබන පරිගණක සඳහා Ceylon Business Appliances Private Limited ආයතනයෙන් එක් UPS බැටරියක් සඳහා වැට් රහිත රු.8,900.00 ක මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර එම මිල ගණන් යටතේ බැටරි 03 ක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව පරිගණකවල ආරක්ෂාව සඳහා UPS බැටරි අත්‍යවශ්‍ය බැවින් වැට් රහිත රු.8,900.00 ක මිල ගණන් යටතේ බැටරි 03 ක් මිලදී ගැනීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

10. 2025.12.15 දින අංක 1/10/06/01-(ගා 10) දරණ "දෛනික පදනම මත පෙර පාසල් ගුරුවරියක් බඳවා ගැනීම,කේ.අචිනි තරුෂිකා මිය - බෙන්තොට ප්‍රාදේශීය සභාව" යන මැයෙන් යුතුව නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්,දකුණු පළාත විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කේ.අචිනි තරුෂිකා මහත්මිය දෛනික පදනමින් පෙර පාසල් ගුරු තනතුරේ සේවය සඳහා යොදවා ගැනීමේදී ඒ සඳහා සභා අරමුදලෙන් වැටුප් ගෙවන බවට මුදල් කමිටු තීරණය ඉදිරිපත් කර නොමැති බැවින් එය කඩිනමින් ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව උක්ත කාරණය සඳහා ගනු ලැබූ මුදල් කමිටු තීරණය ඉදිරිපත් කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

11. 2025.11.28 දින ගි/07 විෂයභාර නිලධාරි විසින් ගබඩාව සඳහා පහත ද්‍රව්‍ය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.
    - 2'' ප්‍රමාණයේ Box File - 35
    - 3'' ප්‍රමාණයේ Box File - 20
    - 4'' ප්‍රමාණයේ Box File - 20
    - File Magazine Holder - 40

12. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 පුහුණු සැලැස්ම මුදල් හා ප්‍රතිපත්ති කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අතර එය මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කරන ලදී.

01. ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා - ගරු සභාපති
02. මිගාර වලල්ලාවිට මැතිතුමා - ගරු මන්ත්‍රී
03. රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා - ගරු මන්ත්‍රී
04. නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා - ගරු මන්ත්‍රී
05. ඩී.ඩී. නදීශාන් වික්‍රමරත්න මැතිතුමා - ගරු මන්ත්‍රී

2025.12.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-</u>**

**<u>7.1. 2025 දෙසැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025 දෙසැම්බර් මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2025 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 51,560,536.90 |
| එකතු කලා මූලධන ලැබීම් :- | රු. 4,625,197.64 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 56,185,734.54** |
| බලපත්‍ර බදු | රු. 41,900.00 |
| සේවක ණය | රු. 976,467.43 |
| තැන්පත් | රු. 1,845,221.11 |
| දේපළ ණය පොළී | රු. 7,522.73 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 749,001.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,800.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 141,000.00 |
| 101 ට බැර | රු. 5,929.62 |
| 201 ට බැර | රු. 30,965.41 |

| | |
|---|---|
| 301 ට බැර | රු. 69,533.03 |
| අගරු චෙක්පත් | රු. 3,000.00 |
| එකතුව | **රු. 60,060,074.87** |
| 2025 දෙසැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 18,298,941.36 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | රු. 6,503,650.40 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 24,802,591.76** |
| දේපළ ණය පොලී | රු. 10,970.91 |
| තැන්පත් | රු. 901,723.78 |
| ගඩඩා අත්තිකාරම් | රු. 295,278.14 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 726,585.00 |
| සේවක ණය | රු. 408,600.00 |
| අගරු චෙක්පත් | රු. 3,000.00 |
| එකතුව | **රු. 27,148,749.59** |

**<u>7.2. 2025. 12.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.12.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ගිණුම, අංක 2759057 දරණ කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**<u>7.3. 2025.12.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2025.12.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| `ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 18,737,307.22 |
| 2. අක්කර බදු | රු. 190,129.00 |
| 3. 1 % බදු | රු. 1,000.00 |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 5,500.00 |
| 8. වෙළඳ ස්ථාන කුලී | රු. 130,670.00 |
| එකතුව | රු. 19,064,606.22 |

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | දිවි නැගුම ප්‍රජා මූල බැංකුවේ වරකමුල්ල සමෘද්ධි සමිතිය | මහ ඉඳුරුව කහවෙගම්මැද්ද මහවත්ත මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ බිල්පත් මුදල ගෙවීම | 1,611,019.78 |

ඉහත ගෙවීම් වවුචරය ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය

**8. වෙනත් කරුණු**

**8.1. ටෙන්ඩර් හා මිල ගණන් :-** නැත

**8.2. ඇස්තමේන්තු හා ගිවිසුම් සභාගත කිරීම :-** නැත

**8.3. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම**

**ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා**

2026 වර්ෂයේ බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පළමු මාසික මහ සභා රැස්වීමේදී ඔබ සියලු දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. අපේ ගරු සභාපතිතුමාගේ මූලික මගපෙන්වීම මත අපට ලස්සන උත්සවයක් පවත්වන්න හැකි වුණා. එදිනම පිරිත් දේශනයක් පවත්වලා පසුදින දානමය පින්කමක් පවත්වලා ඉන් මහා සංඝරත්නයේ ආශිර්වාදය සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය වගේම බෙන්තර සියලුම ජනතාවට ලබාදෙන පුළුවන් වුණා. අපේ භූමියේ අලුත් බවක් තියෙනවා අපේ ප්‍රදේශයේ ජනතාවට ප්‍රාදේශීය සභාවක් විදියට අපි ගැන විශ්වාසයක් තියෙනවා අපි ඒ විශ්වාසය වැඩි කර ගනිමින් බෙන්තර ප්‍රාදේශීය සභාව ලංකාවේ ඉහළම ප්‍රාදේශීය සභාවක් බවට පත් කර ගනිමු.

**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**

අපේ ප්‍රදේශයේ තැනින් තැනට කුණු ගෙනත් දානවා. ප්‍රදේශයේ ජනතාවට අමතරව පිටින් ඇවිල්ලත් කුණු දානවා අතුරුවැල්ල ප්‍රදේශයේ මේ පවතින කුණුගොඩ මම දවස් ගාණක් දැක්කා. අනවශ්‍ය දේවල් පවා ගෙනත් දානවා. අපේ කුණු ට්‍රැක්ටරයේ යන අය ඒවා අරගන්නේ නෑ. ඒ නිසා එතන ඒවා එකතුවෙලා දැන් ස්ථිර කුණු ගොඩක් බවට පත්වෙලා තියෙනවා. මම මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාවත් මේ පිළිබඳව දැනුවත් කරා. මැස්සෝ වහලා දුගඳ හමනවා. මේ පිළිබඳ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලනවා.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

ඔය සම්බන්ධව අපි අවස්ථා 03 ක දී ඒ අයව දැනුවත් කිරීම් සිදුකරා. ඔතන කුණු ගෙනත් දාන්න එපා දානවා නම් තෝරලා දාන්න කියලා කිව්වා. මොකද පිට අය විතරක් නෙවෙයි ඒ අවට අයත් ඔතනට කුණු ගෙනත් දානවා. ඊටත් පස්සේ තාක්ෂණ සේවා නිලධාරි මහතයි, පී.එච්.අයි. මහතායි වැඩ පරිපාලක මහතායි ගෙයින් ගෙට ගිහින් ඒ අයව දැනුවත් කිරීම් කළා.ඒත් කුණු දාන එක නතර කරලා නෑ. මම දැන් එතන බෝඩ් එකක්

ගහන්න කියලා දැනුම් දීල තියෙන්නෙ. එතකං ඒ කුණුගොඩ අයින් කරන්නේ නෑ සිකුරාදට පෙර ඒ බෝඩ් එක එතන ගහයි. ඒ වෙලාවට එතන තියෙන සම්පූර්ණ කුණුගොඩ ඉවත් කරනවා. ඉන්පසු ඒ අයට දිනයක් හා වෙලාවක් දෙනවා ඒ වෙලාවට අපේ රථය එනවා එතකොට රථයට කුණු ගෙනල්ලා දෙන්න ඕන. ගොඩ ගහලා තියන්න බෑ

**<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>**

ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට මටත් ගැටළුවක් ආවා ලයිට් සම්බන්ධව. මට කෝල් එකක් ආවා ලයිට් පැමිණිල්ලක් ගැන. නමුත් ඒ කෙනා කිව්වා ඔබතුමා නැතුව අනිත් පක්ෂයේ කවුරුවත් නැද්ද කියලා එහෙම නැත්නම් වැඩේ කෙරෙන්නේ නෑනේ කියලා. ඒ වෙලාවේ මට පොඩි ලැජ්ජාවක් ආවා. අපිට ලයිට් සම්බන්ධව පැමිලි කරනකොට අපි කියන්නේ පැමිණිලි පොතේ පැමිණිල්ල දාන්න එතකොට ඒවා ඇවිත් හදයි කියලා. නමුත් ඒවා ප්‍රමාදයි. පසුගිය දවස්වල තිබුන උත්සව අවස්ථා හේතුවෙන් මම ඒ අයට පැහැදිලි කිරීම් කරා.

**<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>**

වීථි ලාම්පු සවිකිරීම සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා. සභාපතිතුමා දීපු ක්‍රමවේදය හරහා වීථි පහන් සවි වෙන්නේ නෑ. බැකෝ යන්ත්‍රය පිළිබඳ අවධානය යොමු කරන්න. සභාවෙන් කෙරෙන වැඩ දැනෙන්නෙත් නැත්තේ බැකෝ යන්ත්‍රයේ ගැටලුව නිසා. හැමෝම ඉල්ලන්නේ බැකෝ යන්ත්‍රය. අපි එකට එකතුවෙලා වැඩක් කරමු. සියලු දෙනාට සුභ නව වසරක් වේවා.

**<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>**

මේ  වෙලාවේ විශේෂ ස්තුතියක් කරනවා ඔබතුමා පත්වෙලා මාස හයක් ඇතුළත මේ ස්ථානයට කාර්යාලය රැගෙන ආපු එක ගැන අපිට දැන් ප්‍රියමනාප තැනක් තියෙනවා සභාව කරගෙන යන්න. තව දෙයක් තමයි දැනට එක කැබ් රථයක් විතරයි සභාවේ වැඩකටයුතු කරගෙන යන්න තියෙන්නෙ. ඒකෙන් උදේ ගිහින් කම්කරුවන්ව මාර්ග නඩත්තු කරන ස්ථානයට ගිහින් දානවා. ආපහු ඇවිත් ලයිට් වීම් එක අරගෙන යනවා. නැවත 3,4 වෙද්දි එන්න ඕනා කම්කරුවන්ව නැවත ආයතනයට ගෙනත් දාන්න. ඒ නිසා අපට ලයිට් වීම් එකෙන් හරියට වැඩක් ගන්න තියෙන්නේ පැය සුළු කාලයක් විතරයි. මම ඉල්ලීමක් කරනවා සභාවේ වාහන පැත්ත ගැනත් දැන් අවධානය දෙන්න කියලා. මොකද ලයිට් වාහනයත් දැන් කාලයක් වෙනවා හදන්න දාලා. LD රථයත් දවසට උපරිම ධාවනය කරනවා ඒ රථයත් කැඩුණොත් මොකද කරන්නේ?

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

පසුගිය මාසයේ මෙම කාර්යාලය විවෘත කිරීමේ උත්සව කටයුතු තිබුණා. ඒ සඳහා නිලධාරීන් වගේම මන්ත්‍රීවරු සියලු දෙනත් පක්ෂ පාට භේදයකින් තොරව සහයෝගය දැක්වූවා විවෘත කිරීමේ උත්සවය සඳහාත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සියලු දෙනාට ආරාධනා කළා සියලු දෙනා කතා පැවැත්තුවා උත්සවයේ කටයුතු සාර්ථකව සිද්ධ වුණා. ඔබ සියලු දෙනාටම සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>8.4. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-</u>** නැත

<u>**ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-**</u>
"ගරු මන්ත්‍රීවරුනි, අද දිනට සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා, මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 19 දෙනාට ස්තූතියි."

ප.ව. 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.